# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2011

# ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2011

## ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2011

**මූල්‍ය අනුග්‍රහය**

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

මුද්‍රණය ඃ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි I, II හා III ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මඟින් තොරතුරු සැපයූ ප්‍රධාන/අතිරේක ප්‍රධාන/සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2012 ඔක්තෝබර් 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශනය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර මයා<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර මිය<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය හා සංස්කරණය** | : | එඩ්වඩ් කුලසේකර මයා<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **සැකසුම් කමිටුව** | : | මහාචාර්ය රත්න විජේතුංග මයා<br>වාග් විද්‍යා අංශය<br>කැලණිය විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය ස්වර්ණා ඉහළගම මිය<br>සිංහල භාෂා අංශය<br>කැලණිය විශ්ව විද්‍යාලය<br><br>ප්‍රගීතිකා ජයසේකර මිය<br>සහකාර කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව<br><br>ඩී. එල්. දිනිල් මයා<br>ගුරු උපදේශක<br>ගාල්ල අධ්‍යාපන කලාපය<br><br>කේ. ඩබ්ලිව්. නිහාල් පද්මසිරි මයා<br>උපගුරු, ර/ යායින්න විද්‍යාලය<br>කහවත්ත |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ. ඒ. අයි. බණ්ඩාර මිය.<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු<br><br>දිලිනි භාග්‍යා කුමාරසිංහ මෙනවිය<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10
1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 11
1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 11
1.3.7 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 12

## II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 13
2.1.2 I ප්‍රශ්න පත්‍රය 14
2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 19
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 20
2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 22
2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 22

2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 35
2.3.2 III ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුර, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 35

## III කොටස

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 50
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සංවර්ධනය සඳහා අදහස් හා යෝජනා 51

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

- * අවබෝධයෙන් යුතුව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ කුසලතා සංවර්ධනය වීම
- * නිරවුල් ලිඛිත ප්‍රකාශන සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය වීම
- * විවිධ සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් ජීවිත පරිඥානය ලැබීම
- * ජීවන වෘත්තිවලට අදාළ ව භාෂාව උපයෝගී කර ගැනීමේ කුසලතා වර්ධනය වීම
- * සිංහල සාහිත්‍යය පිළිබඳ රසඥතාව වර්ධනය වීම
- * නිර්මාණ කුසලතා වර්ධනය වීම
- * භාෂා සාහිත්‍ය පරිචය මගින් සංස්කෘතික දායාද, ආචාරධර්ම හා ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයුම් පිළිබඳ කුසලතා වර්ධනය වීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 235116 | 9018 | 244134 |
| දෙමළ | 0 | 0 | 0 |
| ඉංග්‍රීසි | 0 | 0 | 0 |
| **එකතුව** | **235116** | **9018** | **244134** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 44643 | 18.99 | 304 | 3.37 | 44947 | 18.41 |
| B | 40122 | 17.06 | 727 | 8.06 | 40849 | 16.73 |
| C | 65785 | 27.98 | 3155 | 34.99 | 68940 | 28.24 |
| S | 48906 | 20.80 | 3193 | 35.41 | 52099 | 21.34 |
| W | 35660 | 15.17 | 1639 | 18.17 | 37299 | 15.28 |
| **එකතුව** | **235116** | **100** | **9018** | **100** | **244134** | **100** |

වගුව 2

### 1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 26880 | 8453 | 31.45 | 5186 | 19.29 | 6194 | 23.04 | 3874 | 14.41 | 23707 | 88.20 | 3173 | 11.80 |
| 2. ගම්පහ | 24360 | 5649 | 23.19 | 4599 | 18.88 | 6258 | 25.69 | 4294 | 17.63 | 20800 | 85.39 | 3560 | 14.61 |
| 3. කළුතර | 12910 | 3129 | 24.24 | 2320 | 17.97 | 3145 | 24.36 | 2267 | 17.56 | 10861 | 84.13 | 2049 | 15.87 |
| 4. මහනුවර | 15012 | 3238 | 21.57 | 2738 | 18.24 | 3992 | 26.59 | 2869 | 19.11 | 12837 | 85.51 | 2175 | 14.49 |
| 5. මාතලේ | 5265 | 812 | 15.42 | 985 | 18.71 | 1460 | 27.73 | 1033 | 19.62 | 4290 | 81.48 | 975 | 18.52 |
| 6. නුවරඑළිය | 4659 | 766 | 16.44 | 797 | 17.11 | 1310 | 28.12 | 1014 | 21.76 | 3887 | 83.43 | 772 | 16.57 |
| 7. ගාල්ල | 14741 | 3413 | 23.15 | 2674 | 18.14 | 3673 | 24.92 | 2536 | 17.20 | 12296 | 83.41 | 2445 | 16.59 |
| 8. මාතර | 10783 | 2494 | 23.13 | 2035 | 18.87 | 2696 | 25.00 | 1863 | 17.28 | 9088 | 84.28 | 1695 | 15.72 |
| 9. හම්බන්තොට | 8586 | 1545 | 17.99 | 1531 | 17.83 | 2300 | 26.79 | 1614 | 18.80 | 6990 | 81.41 | 1596 | 18.59 |
| 10. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13. වව්නියාව | 163 | 18 | 11.04 | 35 | 21.47 | 41 | 25.15 | 26 | 15.95 | 120 | 73.62 | 43 | 26.38 |
| 14. මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 15. මඩකලපුව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100 |
| 16. අම්පාර | 3942 | 525 | 13.32 | 607 | 15.40 | 1131 | 28.69 | 907 | 23.01 | 3170 | 80.42 | 772 | 19.58 |
| 17. ත්‍රිකුණාමලය | 1372 | 145 | 10.57 | 188 | 13.70 | 364 | 26.53 | 332 | 24.20 | 1029 | 75.00 | 343 | 25.00 |
| 18. කුරුණෑගල | 19672 | 4118 | 20.93 | 3881 | 19.73 | 5568 | 28.30 | 3685 | 18.73 | 17252 | 87.70 | 2420 | 12.30 |
| 19. පුත්තලම | 7139 | 1332 | 18.66 | 1239 | 17.36 | 2070 | 29.00 | 1484 | 20.79 | 6125 | 85.80 | 1014 | 14.20 |
| 20. අනුරාධපුරය | 10667 | 1737 | 16.28 | 1940 | 18.19 | 2904 | 27.22 | 2184 | 20.47 | 8765 | 82.17 | 1902 | 17.83 |
| 21. පොළොන්නරුව | 4908 | 737 | 15.02 | 804 | 16.38 | 1270 | 25.88 | 1024 | 20.86 | 3835 | 78.14 | 1073 | 21.86 |
| 22. බදුල්ල | 9714 | 1637 | 16.85 | 1741 | 17.92 | 2739 | 28.20 | 1962 | 20.20 | 8079 | 83.17 | 1635 | 16.83 |
| 23. මොනරාගල | 6369 | 725 | 11.38 | 964 | 15.14 | 1706 | 26.79 | 1376 | 21.60 | 4771 | 74.91 | 1598 | 25.09 |
| 24. රත්නපුරය | 13547 | 2155 | 15.91 | 2516 | 18.57 | 3744 | 27.64 | 2763 | 20.40 | 11178 | 82.51 | 2369 | 17.49 |
| 25. කෑගල්ල | 9234 | 1815 | 19.66 | 1848 | 20.01 | 2649 | 28.69 | 1698 | 18.39 | 8010 | 86.74 | 1224 | 13.26 |
| **සමස්ත දිවයින** | **209932** | **44443** | **21.17** | **38628** | **18.40** | **55222** | **26.30** | **38805** | **18.48** | **177098** | **84.36** | **32834** | **15.64** |

වගුව 3

1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 11279 | 4378 | 38.82 | 2062 | 18.28 | 2237 | 19.83 | 1379 | 12.23 | 10056 | 89.16 | 1223 | 10.84 |
| 2. හෝමාගම | 3381 | 709 | 20.97 | 654 | 19.34 | 893 | 26.41 | 597 | 17.66 | 2853 | 84.38 | 528 | 15.62 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 6800 | 2020 | 29.71 | 1391 | 20.46 | 1674 | 24.62 | 988 | 14.53 | 6073 | 89.31 | 727 | 10.69 |
| 4. පිළියන්දල | 5420 | 1346 | 24.83 | 1079 | 19.91 | 1390 | 25.65 | 910 | 16.79 | 4725 | 87.18 | 695 | 12.82 |
| 5. ගම්පහ | 7131 | 2225 | 31.20 | 1382 | 19.38 | 1630 | 22.86 | 985 | 13.81 | 6222 | 87.25 | 909 | 12.75 |
| 6 මිනුවන්ගොඩ | 4517 | 816 | 18.07 | 857 | 18.97 | 1255 | 27.78 | 875 | 19.37 | 3803 | 84.19 | 714 | 15.81 |
| 7. මීගමුව | 6498 | 1175 | 18.08 | 1177 | 18.11 | 1747 | 26.89 | 1316 | 20.25 | 5415 | 83.33 | 1083 | 16.67 |
| 8. කැලණිය | 6214 | 1433 | 23.06 | 1183 | 19.04 | 1626 | 26.17 | 1118 | 17.99 | 5360 | 86.26 | 854 | 13.74 |
| 9. කළුතර | 6017 | 1454 | 24.16 | 1044 | 17.35 | 1405 | 23.35 | 1020 | 16.95 | 4923 | 81.82 | 1094 | 18.18 |
| 10. මතුගම | 2676 | 662 | 24.74 | 485 | 18.12 | 708 | 26.46 | 498 | 18.61 | 2353 | 87.93 | 323 | 12.07 |
| 11. හොරණ | 4217 | 1013 | 24.02 | 791 | 18.76 | 1032 | 24.47 | 749 | 17.76 | 3585 | 85.01 | 632 | 14.99 |
| 12. නුවර | 5959 | 2235 | 37.51 | 1187 | 19.92 | 1287 | 21.60 | 801 | 13.44 | 5510 | 92.47 | 449 | 7.53 |
| 13. දෙනුවර | 1602 | 172 | 10.74 | 284 | 17.73 | 489 | 30.52 | 359 | 22.41 | 1304 | 81.40 | 298 | 18.60 |
| 14. ගම්පොල | 2158 | 204 | 9.45 | 312 | 14.46 | 630 | 29.19 | 515 | 23.86 | 1661 | 76.97 | 497 | 23.03 |
| 15. තෙල්දෙනිය | 1453 | 125 | 8.60 | 213 | 14.66 | 420 | 28.91 | 368 | 25.33 | 1126 | 77.49 | 327 | 22.51 |
| 16. වත්තේගම | 1453 | 125 | 8.60 | 213 | 14.66 | 420 | 28.91 | 368 | 25.33 | 1126 | 77.49 | 327 | 22.51 |
| 17. කටුගස්තොට | 2143 | 258 | 12.04 | 417 | 19.46 | 660 | 30.80 | 476 | 22.21 | 1811 | 84.51 | 332 | 15.49 |
| 18. මාතලේ | 2464 | 518 | 21.02 | 488 | 19.81 | 662 | 26.87 | 444 | 18.02 | 2112 | 85.71 | 352 | 14.29 |
| 19. ගලේවෙල | 1841 | 195 | 10.59 | 339 | 18.41 | 542 | 29.44 | 392 | 21.29 | 1468 | 79.74 | 373 | 20.26 |
| 20. නාඋල | 470 | 61 | 12.98 | 86 | 18.30 | 132 | 28.09 | 97 | 20.64 | 376 | 80.00 | 94 | 20.00 |
| 21. විල්ගමුව | 490 | 38 | 7.76 | 72 | 14.69 | 124 | 25.31 | 100 | 20.41 | 334 | 68.16 | 156 | 31.84 |
| 22. නුවරඑළිය | 664 | 64 | 9.64 | 106 | 15.96 | 185 | 27.86 | 186 | 28.01 | 541 | 81.48 | 123 | 18.52 |
| 23. කොත්මලේ | 758 | 125 | 16.49 | 132 | 17.41 | 231 | 30.47 | 151 | 19.92 | 639 | 84.30 | 119 | 15.70 |
| 24. හැටන් | 833 | 128 | 15.37 | 159 | 19.09 | 236 | 28.33 | 203 | 24.37 | 726 | 87.15 | 107 | 12.85 |
| 25. වලපනේ | 932 | 116 | 12.45 | 133 | 14.27 | 261 | 28.00 | 222 | 23.82 | 732 | 78.54 | 200 | 21.46 |
| 26. හඟුරන්කෙත | 1472 | 333 | 22.62 | 267 | 18.14 | 397 | 26.97 | 252 | 17.12 | 1249 | 84.85 | 223 | 15.15 |
| 27. ගාල්ල | 6513 | 1936 | 29.73 | 1214 | 18.64 | 1471 | 22.59 | 978 | 15.02 | 5599 | 85.97 | 914 | 14.03 |
| 28. ඇල්පිටිය | 3000 | 398 | 13.27 | 562 | 18.73 | 836 | 27.87 | 615 | 20.50 | 2411 | 80.37 | 589 | 19.63 |
| 29. අම්බලන්ගොඩ | 3399 | 731 | 21.51 | 596 | 17.53 | 859 | 25.27 | 595 | 17.51 | 2781 | 81.82 | 618 | 18.18 |
| 30. උඩුගම | 1829 | 348 | 19.03 | 302 | 16.51 | 507 | 27.72 | 348 | 19.03 | 1505 | 82.29 | 324 | 17.71 |
| 31. මාතර | 4672 | 1376 | 29.45 | 873 | 18.69 | 1041 | 22.28 | 723 | 15.48 | 4013 | 85.89 | 659 | 14.11 |
| 32. අකුරැස්ස | 1865 | 389 | 20.86 | 349 | 18.71 | 482 | 25.84 | 335 | 17.96 | 1555 | 83.38 | 310 | 16.62 |
| 33. මුලටියන-හක්මන | 2058 | 370 | 17.98 | 407 | 19.78 | 557 | 27.07 | 382 | 18.56 | 1716 | 83.38 | 342 | 16.62 |
| 34. මොරවක-දෙනියාය | 2188 | 359 | 16.41 | 406 | 18.56 | 616 | 28.15 | 423 | 19.33 | 1804 | 82.45 | 384 | 17.55 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 2458 | 443 | 18.02 | 450 | 18.31 | 663 | 26.97 | 453 | 18.43 | 2009 | 81.73 | 449 | 18.27 |
| 36. හම්බන්තොට | 3646 | 554 | 15.19 | 647 | 17.75 | 935 | 25.64 | 733 | 20.10 | 2869 | 78.69 | 777 | 21.31 |
| 37. වලස්මුල්ල | 2482 | 548 | 22.08 | 434 | 17.49 | 702 | 28.28 | 428 | 17.24 | 2112 | 85.09 | 370 | 14.91 |
| 38. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 39. දූපත් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 40. තෙන්මාරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 41. වලිකාමම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 42. වඩමරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 43. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 44. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 45. මඩු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 46. වව්නියාව | 163 | 18 | 11.04 | 35 | 21.47 | 41 | 25.15 | 26 | 15.95 | 120 | 73.62 | 43 | 26.38 |
| 47. වව්නියාව උතුර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 48. මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 49. තුනුක්කායි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 50. මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 51. කල්කුඩා | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100 |
| 52. පදිරිප්පු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 53. මඩකලපුව මධ්‍යම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 54. අම්පාර | 2276 | 370 | 16.26 | 374 | 16.43 | 682 | 29.96 | 475 | 20.87 | 1901 | 83.52 | 375 | 16.48 |
| 55. කල්මුනේ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 56. සමන්තුරෙයි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 57. මහඔය | 593 | 49 | 8.26 | 74 | 12.48 | 159 | 26.81 | 174 | 29.34 | 456 | 76.90 | 137 | 23.10 |
| 58. දෙහිඅත්තකණ්ඩිය | 1065 | 106 | 9.95 | 159 | 14.93 | 288 | 27.04 | 256 | 24.04 | 809 | 75.96 | 256 | 24.04 |
| 59. අක්කරෙයිපත්තුව | 8 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 25.00 | 2 | 25.00 | 4 | 50.00 | 4 | 50.00 |
| 60. ත්‍රිකුණාමලය | 428 | 38 | 8.88 | 65 | 15.19 | 106 | 24.77 | 94 | 21.96 | 303 | 70.79 | 125 | 29.21 |
| 61. මුතූර් | 5 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 20.00 | 4 | 80.00 | 5 | 100.00 | 0 | 0.00 |
| 62. කන්තලේ | 934 | 106 | 11.35 | 123 | 13.17 | 256 | 27.41 | 234 | 25.05 | 719 | 76.98 | 215 | 23.02 |
| 63. කින්නියා | 5 | 1 | 20.00 | 0 | 0.00 | 1 | 20.00 | 0 | 0.00 | 2 | 40.00 | 3 | 60.00 |
| 64. කුරුණෑගල | 4748 | 1472 | 31.00 | 900 | 18.96 | 1143 | 24.07 | 731 | 15.40 | 4246 | 89.43 | 502 | 10.57 |
| 65. කුලියාපිටිය | 3462 | 825 | 23.83 | 770 | 22.24 | 977 | 28.22 | 570 | 16.46 | 3142 | 90.76 | 320 | 9.24 |
| 66. නිකවැරටිය | 2614 | 492 | 18.82 | 509 | 19.47 | 800 | 30.60 | 487 | 18.63 | 2288 | 87.53 | 326 | 12.47 |
| 67. මහව | 3215 | 440 | 13.69 | 594 | 18.48 | 948 | 29.49 | 750 | 23.33 | 2732 | 84.98 | 483 | 15.02 |
| 68. ගිරිඋල්ල | 3161 | 503 | 15.91 | 635 | 20.09 | 915 | 28.95 | 651 | 20.59 | 2704 | 85.54 | 457 | 14.46 |
| 69. ඉබ්බාගමුව | 2472 | 386 | 15.61 | 473 | 19.13 | 785 | 31.76 | 496 | 20.06 | 2140 | 86.57 | 332 | 13.43 |
| 70. පුත්තලම | 2359 | 298 | 12.63 | 392 | 16.62 | 719 | 30.48 | 563 | 23.87 | 1972 | 83.59 | 387 | 16.41 |
| 71. හලාවත | 4780 | 1034 | 21.63 | 847 | 17.72 | 1351 | 28.26 | 921 | 19.27 | 4153 | 86.88 | 627 | 13.12 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 72. අනුරාධපුරය | 3660 | 830 | 22.68 | 651 | 17.79 | 886 | 24.21 | 671 | 18.33 | 3038 | 83.01 | 622 | 16.99 |
| 73. තඹුත්තේගම | 2041 | 206 | 10.09 | 376 | 18.42 | 624 | 30.57 | 465 | 22.78 | 1671 | 81.87 | 370 | 18.13 |
| 74. කැකිරාව | 1854 | 305 | 16.45 | 337 | 18.18 | 492 | 26.54 | 379 | 20.44 | 1513 | 81.61 | 341 | 18.39 |
| 75. ගලෙන්බිඳුනුවැව | 1400 | 186 | 13.29 | 258 | 18.43 | 395 | 28.21 | 294 | 21.00 | 1133 | 80.93 | 267 | 19.07 |
| 76. කැබිතිගොල්ලෑව | 1712 | 210 | 12.27 | 318 | 18.57 | 507 | 29.61 | 375 | 21.90 | 1410 | 82.36 | 302 | 17.64 |
| 77. පොළොන්නරුව | 1367 | 251 | 18.36 | 256 | 18.73 | 346 | 25.31 | 264 | 19.31 | 1117 | 81.71 | 250 | 18.29 |
| 78. හිඟුරක්ගොඩ | 2103 | 320 | 15.22 | 315 | 14.98 | 533 | 25.34 | 451 | 21.45 | 1619 | 76.99 | 484 | 23.01 |
| 79. දිඹුලාගල | 1438 | 166 | 11.54 | 233 | 16.20 | 391 | 27.19 | 309 | 21.49 | 1099 | 76.43 | 339 | 23.57 |
| 80. බදුල්ල | 2707 | 433 | 16.00 | 514 | 18.99 | 751 | 27.74 | 569 | 21.02 | 2267 | 83.75 | 440 | 16.25 |
| 81. බණ්ඩාරවෙල | 2299 | 625 | 27.19 | 449 | 19.53 | 619 | 26.92 | 356 | 15.48 | 2049 | 89.13 | 250 | 10.87 |
| 82. මහියංගනය | 1922 | 200 | 10.41 | 276 | 14.36 | 562 | 29.24 | 431 | 22.42 | 1469 | 76.43 | 453 | 23.57 |
| 83. වැලිමඩ | 2200 | 309 | 14.05 | 410 | 18.64 | 632 | 28.73 | 477 | 21.68 | 1828 | 83.09 | 372 | 16.91 |
| 84. පස්සර | 586 | 70 | 11.95 | 92 | 15.70 | 175 | 29.86 | 129 | 22.01 | 466 | 79.52 | 120 | 20.48 |
| 85. මොනරාගල | 1999 | 242 | 12.11 | 320 | 16.01 | 534 | 26.71 | 405 | 20.26 | 1501 | 75.09 | 498 | 24.91 |
| 86. වැල්ලවාය | 2867 | 353 | 12.31 | 395 | 13.78 | 722 | 25.18 | 661 | 23.06 | 2131 | 74.33 | 736 | 25.67 |
| 87. බිබිල | 1503 | 130 | 8.65 | 249 | 16.57 | 450 | 29.94 | 310 | 20.63 | 1139 | 75.78 | 364 | 24.22 |
| 88. රත්නපුර | 5425 | 1184 | 21.82 | 1076 | 19.83 | 1402 | 25.84 | 943 | 17.38 | 4605 | 84.88 | 820 | 15.12 |
| 89. බලන්ගොඩ | 2379 | 297 | 12.48 | 475 | 19.97 | 700 | 29.42 | 524 | 22.03 | 1996 | 83.90 | 383 | 16.10 |
| 90. නිවිතිගල | 2438 | 248 | 10.17 | 412 | 16.90 | 724 | 29.70 | 594 | 24.36 | 1978 | 81.13 | 460 | 18.87 |
| 91. ඇඹිලිපිටිය | 3305 | 426 | 12.89 | 553 | 16.73 | 918 | 27.78 | 702 | 21.24 | 2599 | 78.64 | 706 | 21.36 |
| 92. කෑගල්ල | 3872 | 972 | 25.10 | 791 | 20.43 | 1063 | 27.45 | 630 | 16.27 | 3456 | 89.26 | 416 | 10.74 |
| 93. මාවනැල්ල | 2689 | 437 | 16.25 | 514 | 19.11 | 762 | 28.34 | 541 | 20.12 | 2254 | 83.82 | 435 | 16.18 |
| 94. දෙහිඕවිට | 2673 | 406 | 15.19 | 543 | 20.31 | 824 | 30.83 | 527 | 19.72 | 2300 | 86.05 | 373 | 13.95 |
| **95. පිරිවෙන්** | **8** | **0** | **0.00** | **0** | **0.00** | **8** | **100** | **0** | **0.00** | **8** | **100** | **0** | **0.00** |
| **සමස්ත දිවයින** | **209932** | **44443** | **21.17** | **38628** | **18.40** | **55222** | **26.30** | **38805** | **18.48** | **177098** | **84.36** | **32834** | **15.64** |

වගුව 4

### 1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 488 | 0.20 | 244134 | 100.00 |
| 81 - 90 | 13940 | 5.71 | 243646 | 99.80 |
| 71 - 80 | 33788 | 13.84 | 229706 | 94.09 |
| 61 - 70 | 42723 | 17.50 | 195918 | 80.25 |
| 51 - 60 | 47021 | 19.67 | 153195 | 62.75 |
| 41 - 50 | 40380 | 16.54 | 105174 | 43.08 |
| 31 - 40 | 29809 | 12.21 | 64794 | 26.54 |
| 21 - 30 | 19165 | 7.85 | 34985 | 14.33 |
| 11 - 20 | 11059 | 4.53 | 15820 | 6.48 |
| 01 - 10 | 4761 | 1.95 | 4761 | 1.95 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0 |

වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් 244134 අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 29809 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 12.21% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 64794 ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 26.54% කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 4 ප්‍රශ්නයටයි. එම ප්‍රතිශතය 88% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 7 ප්‍රශ්නයටයි. එම ප්‍රතිශතය 19% කි.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- මෙම ප්‍රශ්න පත්‍රයෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද අංක 1 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 98%ක් පිළිතුරු සපයා ඇති අතර අංක 5 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ 91% ක් පමණි.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා :- අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 17% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20 න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 20% කි.

ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

## 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : අංක 1 ප්‍රශ්නයෙහි i (අ) කොටසෙහි පහසුතාව 0.59 කි. වැඩිම පහසුතාව ඇත්තේ අංක 4 ප්‍රශ්නයේ ii කොටසටයි. එය 0.95 කි. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ V (ආ) කොටසටයි. එය 0.18 කි.

## 1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 5 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි මුල් ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද අංක 1 ප්‍රශ්නය සඳහා 95% ක් ද අංක 4 ප්‍රශ්නය සඳහා 78% ක් ද පමණක් පිළිතුරු සපයා ඇත. අංක 5, 6, 7 ප්‍රශ්න අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර අංක 6 ප්‍රශ්නය සඳහා 58% ක් ද අංක 7 ප්‍රශ්නය සඳහා 13% ක් ද පිළිතුරු සපයා ඇත.

## 1.3.6 ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 6 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ, එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 13% කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 20 න් 0% - 25% ප්‍රාන්තරයේ, එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 25% කි.

**1.3.7. III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය**




ප්‍රස්තාරය 7 (RD/16/04/OL පෝර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : අංක 1 ප්‍රශ්නයෙහි 1 (අ) කොටසෙහි පහසුතාව 0.63 කි. වැඩිම පහසුතාව ඇත්තේ අංක 3 ප්‍රශ්නයේ විකල්ප (i) කොටසටයි. එය 0.93 කි. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ 3 (ආ) කොටසටයි. එය 0.06 කි.

II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 ප්‍රශ්න පත්‍රවල ස්වභාවය

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙහි (21) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ඉදිරිපත් කෙරේ. ඒවා අතරින් I පත්‍රය සහ II පත්‍රය යන ප්‍රශ්න පත්‍ර දෙකම අපේක්ෂකයින්ට එක වර දෙනු ලබන අතර එම පත්‍ර දෙකම සඳහා නියමිත කාලය පැය තුනකි. III පත්‍රය සඳහා නියමිත කාලය පැය දෙකකි.

**අවසාන ලකුණු ගණනය කිරීම.**

| | | | | |
|---|---|---|---|---|
| I | පත්‍රය සඳහා | - | ලකුණු | 40 |
| II | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| III | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| | එකතුව | - | ලකුණු | 200 |

අවසාන ලකුණ - $200 \div 2 = 100$

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* මුළු ලකුණු 40 කි.
* වරණ හතර බැගින් ඇති බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1) (2) (3) හා (4) වරණ වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණ තේරීම අපේක්ෂා කෙරේ.
* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.
* සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය යටතේ,

භාෂා කුසලතා, ව්‍යාකරණ භාවිතය පිළිබඳ කුසලතා, භාෂා භාවිතය පිළිබඳ කුසලතා සහ විශ්ලේෂණය හා අවබෝධය පිළිබඳ කුසලතා මැනීමේ අරමුණින් මෙම බහුවරණ ප්‍රශ්න 40 සකස්කර ඇත.

2.1.2 **I ප්‍රශ්න පත්‍රය**

- අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. බඩු මිල ඉහළ යාමත් සමඟ තම **මඩිය තරකර ගැනීමට** බොහෝ වෙළෙන්දෝ උත්සාහ ගත්හ.
   (1) වැඩිපුර භාණ්ඩ විකුණා ගැනීමට (2) නොනිසි ලෙස තම ලාභය වැඩි කර ගැනීමට
   (3) තම ගබඩා සම්පූර්ණයෙන් ම පුරවා ගැනීමට (4) ව්‍යාපාර සඳහා වැඩිපුර මුදල් යෙදවීමට

2. තම සේවකයාට **අනර්ථයක්** කිරීමට, සේව්‍යයා තුළ අදහසක් නැති බව සෙස්සන්ට වැටහෙන්නට විය.
   (1) යහපතක් (2) ආධාරයක්
   (3) අවැඩක් (4) අත්උදව්වක්

3. ඔහු තමන්ට පැවරූ කාර්යයෙහි **ඉස්පාසුවක් නොමැතිව** නිරත වුව ද, නිතර ම සිනාමුසු මුහුණින් යුතුව සිටියේ ය.
   (1) අවිවේකීව (2) සෙමින්
   (3) නිහඬව (4) ඉක්මනින්

4. නොනිසි තනතුර ලැබීමත් සමඟ ඔහුගේ **ඔළුව ඉදිමී** ඇති බව සෙස්සෝ පැවසූහ.
   (1) හිසෙහි රෝගයක් සෑදී (2) අහංකාරයට පත් වී
   (3) තනතුරෙන් උසස් වී (4) හිස අවුල් වී

- අංක **5** සිට **8** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

5. වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් විසින් රචිත ග්‍රන්ථවලින් එතුමන්ගේ ..................... මතුව පෙනේ.
   (1) පෞරුෂය (2) ඖචිත්‍යය
   (3) පාණ්ඩිත්‍යය (4) අභිමානය

6. ..................... යන්න දේදුන්නට පර්යාය වචනයකි.
   (1) කුසුම්කඩ (2) සුරඹ
   (3) මනයොන් (4) ඉඳුසැව්

7. ග්‍රන්ථයේ ප්‍රස්තාවනාව තුළ ම එහි ..................... අන්තර්ගත කොට ඇත.
   (1) රසාස්වාදය (2) මුඛ්‍යාධ්‍යාශය
   (3) සූචිය (4) ව්‍යාඛ්‍යානය

8. ආචාර්ය ඊ.ඩබ්ලිව්. අධිකාරම් මහතා ..................... ම ජනතා බුහුමනට සුදුසු වූ මානව රත්නයක් විය.
   (1) අන්‍යාකාරයෙන් (2) නිසර්ගයෙන්
   (3) නිස්සරණාධ්‍යාශයෙන් (4) සර්වප්‍රකාරයෙන්

9. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
   (1) අදර, අදහස්, අදිති, අදිසි (2) අලගු, අලක, අලාභ, අලෙවු
   (3) කොච්චි, කොටු, කොටස්, කොතඹුරු (4) කසමල්, කසඹිලිය, කහවනු, කස්තාන

10. අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
    (1) පාසලේ සියළු සිසුහු පුස්තකාලය අසළට රොක් වූහ.
    (2) රැකියාව සඳහා ආකර්ශනීය දීමනා ඇතුළත් සිත් ගන්නා සුළු වැටුපක් දෙනු ලැබේ.
    (3) කේ. ජයතිලක මහතාගේ විශිෂ්ට බුද්ධි ප්‍රභාවත්, ඥනවත්භාවයත් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රය එකලු කළේ ය.
    (4) සභාවේ සියලු දෙනාගේ ම හඬ අභිබවමින් ලේඛම්වරයා ස්තුති කතාව ඉදිරිපත් කළේ ය.

11. අර්ථයෙන් විරුද්ධ පද දෙකක් එකතු වී සෑදෙන යුගල පදයක් ඇතුළත් **නොවන පද පේළිය** තෝරන්න.
    (1) අයවැය, සිරිත්විරිත්, උඩබිම, පිංපව් (2) ලාභාලාභ, ගොඩමඩ, හොඳනරක, ඇතමැත
    (3) ගුණාගුණ, එහාමෙහා, පොතපත, කැමබීම (4) උස්මිටි, ඔබමොබ, යාම්ඊම්, ඇත්තනැත්ත

12. එක් එක් පේළියේ මුලින් දක්වෙන පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
    (1) ආවතේව - උපස්ථාන, වත්පිළිවෙත්, උවටැන්, වතාවත්
    (2) උද්දමය - ආනන්දය, ප්‍රමෝදය, ප්‍රහර්ෂය, සොම්නස
    (3) ධ්වනිය - නාදය, ශබ්දය, ධ්‍යානය, රාවය
    (4) මුහුණ - වත, වුවන, මුව, වක්ත්‍රය

13. එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් දෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) දීන - නියාලු, බයාදු, යටහත්, පරාධීන (2) කය - ගත, සිරුර, වෙර, ඇඟ
(3) ශිෂ්‍ය - ගෝල, ඡාත්‍ර, සිසු, ශිෂ්ට (4) බහුශ්‍රැත - උගත්, වියත්, පැසුණු, අව්‍යක්ත

- අංක **14** හා **15** වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත වාක්‍යාංශ සඳහා යෙදිය හැකි තනි පදය තෝරන්න.

14. නෙළුම්මල **මඩෙහි උපදින** අලංකාර පුෂ්පයකි.
(1) පංකජ (2) අණ්ඩජ (3) ජලජ (4) කණ්ඨජ

15. **රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව** නැති අය පරෙස්සම් වීම යෙහෙකි.
(1) ප්‍රතිජීවනය (2) ප්‍රතිශක්තිය (3) ප්‍රතිනිර්මාණය (4) ප්‍රතිචක්‍රීකරණය

- අංක **16** සිට **19** තෙක් වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ ප්‍රවර්ගයකට අයත් දැ'යි තෝරන්න.

16. කිසිවකුට නොදෙවැනි වන උදාර සේවයක් කළ ඒ.එන්.එස්. කුලසිංහ මැතිඳු **ආශ්චර්යවත්** මිනිසෙකි.
(1) තද්ධිත (2) කෘදන්ත (3) නිපාත (4) සර්වනාම

17. **අද** වැසි සහිත දිනයකි.
(1) තද්ධිත (2) කෘදන්ත (3) නිපාත (4) සමාස

18. රිය අනතුර දුටු අය එතැනට **වේගයෙන්** දිව ගියෝ ය.
(1) නාම විශේෂණ (2) ක්‍රියා විශේෂණ (3) සර්වනාම (4) කෘදන්ත

19. විවිධ ප්‍රසංගය සඳහා දිවා රාත්‍රි දෙකෙහි ම **ඔවුහු** වෙහෙස වූහ.
(1) ජාතිනාම (2) සර්වනාම (3) තද්ධිතනාම (4) ගුණනාම

- අංක **20** සිට **22** තෙක් ඇති ප්‍රස්තාව පිරුළු සඳහා **වඩාත් ගැළපෙන** අදහස ඇති වරණය තෝරන්න.

20. නියර මිටි තැනිත්ලු වතුර බහින්නේ
(1) විපතක් සිදුවන අවස්ථාවල දී ඒ ගැන නොතකා විනෝද වීම
(2) කිසියම් වැරැද්දක් වූ විට එය අහිංසක මිනිසුන් මත පැවරීම
(3) නොලැබෙන දෙයක් වෙනුවෙන් තමා අත ඇති දේ විනාශ කර ගැනීම
(4) අවස්ථානුකූල ව ගැළපෙන පරිදි කටයුතු කිරීම

21. හිහන්නාගේ පාත්තරේට හෙනහුරා වැටුණා වගේ
(1) එක් කරදරයකට පත්ව සිටින්නකු තවත් කරදරයකට පත් වීම
(2) අහිංසක පුද්ගලයකුට වටිනා දෙයක් ලැබීම
(3) හිහන්නාගේ ආහාරයට තවත් පුද්ගලයකු එකතු වීම
(4) කරදරයකට පත්ව සිටින්නකුට ඉන් මිදීමට මගක් පෑදීම

22. පනින රිළවුන්ට ඉනිමං බැන්ද වගේ
(1) තමන් කළ වැරැද්දකට තමන් ම දඬුවම් කර ගැනීම
(2) වැරදි දේ දක දක එම වැරදිවලට අනුබල දීම
(3) ඉහළින් යන සතුන්ට ආධාරකයක් සැපයීම
(4) කෙනකු යම් විපතක් කිරීමට සූදානම් වීම

23. **වෘද්ධිය - අභිවෘද්ධිය** යන වචන යුගලයෙහි දෙවන වචනය, පළමුවන වචනයෙහි
(1) අර්ථයට සමාන වේ. (2) අර්ථයට විරුද්ධ වේ.
(3) අර්ථය වැඩි කරයි. (4) අර්ථය අඩු කරයි.

24. පහත දක්වෙන වාක්‍යයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත වචන අයත්වන ක්‍රියාපද වර්ග අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
හිරු **බැස යද්දී** තාත්තා කුඹුරෙන් ගොඩට **පැමිණ** අම්මා සමඟ **කතාකරමින්** නිවස දෙසට **ගියේ ය.**
(1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(3) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(4) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

25. නොයෙක් සහ මාර්ගෝපදේශ යන වචන දෙක ම නිවැරදි ලෙස විසන්ධි කර ඇති වරණය තෝරන්න.
(1) නො + එක්, මාර්ග + උපදේශ
(2) නොය + එක්, මාර්ග + උපදේශ
(3) නො + එක්, මාර්ගෝ + පදේශ
(4) නොයෙ + ක්, මාර්ගෝප + දේශ.

26. පංචේන්ද්‍රියයන්ට අරමුණු වන විවිධ අවස්ථා හා සිදුවීම් සිතට කා වැදී, නව සංකල්ප රූප මතු වීම හැඳින්වෙන්නේ,
(1) උපමාලංකාරය නමිනි.
(2) පරිකල්පනය නමිනි.
(3) වාක් විචිත්‍රත්වය නමිනි.
(4) උත්ප්‍රාසය නමිනි.

● අංක **27** හා **28** ලිඛිත ව්‍යවහාරයට හැරවූ විට **වඩාත් නිවැරදි** වාක්‍යය ඇති වරණය තෝරන්න.

27. ගුරුළුගෝමි, විද්‍යාචක්‍රවර්ති වගේ පණ්ඩිතයෝ සිංහල සාහිත්‍යයට ලොකු සේවයක් කළා.
(1) සිංහල සාහිත්‍යයට ගුරුළුගෝමි, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරුන් සුවිසල් සේවයක් ඉටු කළේ ය.
(2) ගුරුළුගෝමි, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරුන් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට වටිනා මෙහෙයක් ඉටු කළහ.
(3) ගුරුළුගෝමි, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරු සිංහල සාහිත්‍යයට සුවිසල් මෙහෙයක් ඉටු කළහ.
(4) සිංහල සාහිත්‍යයේ පෝෂණයට ගුරුළුගෝමි, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරුන් වටිනා මෙහෙයක් ඉටු කරන ලදහ.

28. ලංකාවේ ඉංජිනේරු මහත්තුරු කම්කරුවොත් එක්ක හරි හරියට පාලමේ වැඩ ඉවර කළා.
(1) ශ්‍රී ලාංකික ඉංජිනේරුවෝ කම්කරුවන් සමඟ එකතු වී පාලමේ වැඩ නිම කළහ.
(2) ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් කම්කරුවන් සමඟ එක් වී පාලමේ වැඩ නිම කළහ.
(3) ශ්‍රී ලාංකික ඉංජිනේරුවරුන් ද කම්කරුවෝ ද එකට එකතු වී පාලමේ වැඩ අවසන් කළහ.
(4) ශ්‍රී ලාංකික ඉංජිනේරුවෝ ද කම්කරුවෝ ද එකතු වී පාලමේ වැඩ නිම කළේ ය.

29. **දෙතිත හා යුගල උඩුකොමා** යන විරාම ලක්ෂණ යෙදෙන අවස්ථා දෙකක් අනුපිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.
(1) නිදර්ශන දක්වන අවස්ථාවල, යම් වචනයක් හෝ කරුණක් හෝ අවධාරණය කර පෙන්වන අවස්ථාවල
(2) නිදර්ශන දක්වන අවස්ථාවල, ප්‍රකෘති භාෂණ දක්වන අවස්ථාවල
(3) ප්‍රකෘති භාෂණ දක්වන අවස්ථාවල, යම් අදහසක් විකෘති කථනයෙන් දක්වන අවස්ථාවල
(4) වාක්‍ය අවසන් කරන අවස්ථාවල, ප්‍රකෘති භාෂණ දක්වන අවස්ථාවල

30. පහත සඳහන් ගීත ඛණ්ඩයේ ඇති **රූපක දෙකක්** ඇතුළත් වන වරණය තෝරන්න.

ගමට කලින් හිරු මුළු තැන් ගෙට වඩනා
ඒ හිරු එළියේ නැණ මල් පොඩි පිපුණා
ඒ මල් සුවඳේ අද ලොව්තුරු සුව විඳිනා
කලා වැවේ නිල් දියවර අපෙ අම්මා

(1) හිරු එළිය, නැණ මල් පොඩි
(2) හිරු එළිය, මල් සුවඳ
(3) නැණමල් පොඩි, කලා වැවේ නිල් දියවර අපෙ අම්මා
(4) ලොව්තුරු සුව, කලා වැවේ නිල් දියවර අපෙ අම්මා

● අංක **31** සිට **33** තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වඩාත් **නිවැරදි** වාක්‍යය තෝරන්න.

31. (1) සාකච්ඡාවට සහභාගි වන්නෝ ගරු මර්සලින් ජයකොඩි පියතුමාණෝ ය.
(2) රාජ්‍ය සාහිත්‍ය උත්සවයේ සම්මාන ලබන්නේ ලේඛකයන් ය.
(3) වේදිකාවේ ගී ගයන්නේ ගායකයෝ ය.
(4) වචන්නන් දිනන්නෝය යන කියමනක් අප අතර පවතී.

32. (1) සියලු සත්ත්වයෝ සුවපත් වේවා !
(2) ලෝක වාසීහු නිරෝග වෙත්වා !
(3) අපි නිදුක් වෙත්වා !
(4) දරුවන් ලෝකයාගේ කරුණාව හා ආදරය ලබත්වා !

33. (1) ඔහු ද මම ද උත්සවයට සහභාගි වන්නෙමු.
(2) ප්‍රධාන අමුත්තෝ ද උත්සවයට සහභාගි වෙති'යි අපි සිතුවෙමු.
(3) නළුවෙක්ව සිටි ජෝ අබේවික්‍රම මහතා පසුව ලේඛකයෙකු ද විය.
(4) ඇතැම් රියදුරෝ වාහන පදවන විට මාර්ග නීති නොපිළිපදින්නේ ඇයි?

● අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය සහිත වාක්‍යය තෝරන්න.

34. සංවර්ධනය වෙමින් පවතින රටවල පොදු ජනතාවට අලුත් ම විද්‍යාත්මක සිදුවීම් ගැන දැන ගන්නට සැලැස්වීමේ බලවත් අවශ්‍යතාවක් තිබේ.
(1) විද්‍යාවේ ඇතිවන නව ප්‍රවණතා පිළිබඳ ව සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාව දැනුවත් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී.
(2) නව විද්‍යාත්මක ප්‍රවණතා පිළිබඳ ව අනිවාර්යයෙන් දැනගත යුත්තේ සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවයි.
(3) සංවර්ධනය වන රටවල ජනතාව විද්‍යාවේ නව ප්‍රවණතා පිළිබඳ ව දැනුවත් වීම අවශ්‍ය වේ.
(4) සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාව විද්‍යාත්මක නව සංකල්ප පිළිබඳ ව දැනගෙන තිබීම අනිවාර්ය අවශ්‍යතාවකි.

35. රටක යටිතල පහසුකම්වල සංවර්ධනයක් සිදු වී තිබීම එරට සමෘද්ධිමත්භාවයේ එක් සංකේතයක් වශයෙන් සැලකිය හැකි ය.
(1) රටක් සංවර්ධනය වන්නේ එරට යටිතල පහසුකම් තිබුණොත් පමණි.
(2) රටක සංවර්ධනයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ යටිතල පහසුකම් දියුණු වී තිබීම ය.
(3) රටක යටිතල පහසුකම් දියුණු වී තිබීම එරට සංවර්ධනයේ ලක්ෂණයකි.
(4) යටිතල පහසුකම් දියුණු කිරීමෙන් රටක් සංවර්ධනය කළ හැකි ය.

36. අර්ථවත් විචාරයක් උදෙසා කාව්‍යයේ භාෂාව වැදගත්වන බව ඇතැම් අපරදිග විචාරකයන්ගේ මතයයි.
(1) විචාරය උදෙසා කාව්‍යයේ භාෂාව වැදගත් වන බව විචාරකයෝ පවසති.
(2) අපරදිග විචාරක මතය වන්නේ අර්ථවත් වූ විචාරයක් සඳහා කාව්‍යයේ භාෂාව ඉතා වැදගත් වන බවයි.
(3) කාව්‍යයේ භාෂාව අර්ථවත් විචාරයකට අත්‍යවශ්‍ය බව අපරදිග විචාරක මතයයි.
(4) අර්ථ සම්පන්න විචාරයකට කාව්‍යයේ භාෂාව වැදගත් වන බව අපරදිග සමහර විචාරකයෝ පවසති.

37. පහත දක්වෙන වාක්‍යයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත පදයේ අදහස දක්වෙන වරණය තෝරන්න.
රාජසිංහයන්ගේ රාජ්‍ය කාලය සීතාවකට **ක්‍ෂත යුගයක්** විය.
(1) විදේශ ආක්‍රමණ පැවැති යුගයකි. (2) ඉතා ම සමෘද්ධව පැවැති යුගයකි.
(3) දැඩි නියඟයක් පැවැති යුගයකි. (4) දැඩි අවුල් වියවුල් සහිත යුගයකි.

38. 'හීවැල් මොටද බිම හාරන ඌරන්ට' යන පද්‍ය පාදයේ **හීවැල්** යනු
(1) නඟුලට සම්බන්ධ කොටසකි. (2) වනාන්තරයේ වැවෙන වැල් විශේෂයකි.
(3) ඌරන්ගේ ශරීරාංගයකි. (4) ඊතලයේ කොටසකි.

39. අතීතයේ පටන් ශ්‍රී දළදා මාලිගාවේ සිදු කරනු ලබන විශේෂ පූජා ක්‍රමයක් **නොවන්නේ,**
(1) නානුමුර මංගල්‍යය ය. (2) කාර්තික මංගල්‍යය ය.
(3) අලුත් සහල් මංගල්‍යය ය. (4) කෝණ මංගල්‍යය ය.

40. 'මනකල් කමලුපුල් වන මිණි ගණ පෙනිණි' යන පද්‍යපාදයේ අදහස නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
(1) සිත් ඇදගන්නා නෙළුම්, මානෙල් වන නමැති මාණික්‍ය සමූහය පෙනිණි.
(2) සිත් පුබුදු කරන පිපුණු නෙළුම් වනයක් සේ මැණික් සමූහය පෙනිණි.
(3) මනස්කාන්ත වූ මානෙල් සහ ඕලු යන මැණික් සමූහය පෙනිණි.
(4) වනයේ ඇති සිත් ඇදගන්නා මැණික් මෙන් නෙළුම් හා මානෙල් පෙනිණි.

❊ ❊

### 2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ...2.... | 21. | ...1.... |
| 02. | ...3.... | 22. | ...2.... |
| 03. | ...1.... | 23. | ...3.... |
| 04. | ...2.... | 24. | ...4.... |
| 05. | ...3.... | 25. | ...1.... |
| 06. | ...4.... | 26. | ...2.... |
| 07. | ...2.... | 27. | ...3.... |
| 08. | ...4.... | 28. | ...1.... |
| 09. | ...1.... | 29. | ...2.... |
| 10. | ...3.... | 30. | ...3.... |
| 11. | ...3.... | 31. | .1,.2... |
| 12. | ...3.... | 32. | ...2.... |
| 13. | ...4.... | 33. | ...1.... |
| 14. | ...1.... | 34. | ...1.... |
| 15. | ...2.... | 35. | ...3.... |
| 16. | ...1.... | 36. | ...4.... |
| 17. | ...3.... | 37. | ...2.... |
| 18. | ...2.... | 38. | ...1.... |
| 19. | ...2.... | 39. | ...4.... |
| 20. | ...2.... | 40. | ...1.... |

සටහන : 31 වන ප්‍රශ්නය සඳහා පිළිතුර වශයෙන් 1 හා 2 වරණ දෙකම නිවැරදි සේ සැලකේ

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

**I පත්‍රය සඳහා අවසාන ලකුණු 40 ÷ 2 = 20**

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)




| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|
| භාෂා කුසලතා | 4 (88%) | 7 (19%) |
| ව්‍යාකරණ | 18 (86%) | 32 (24%) |
| භාෂා සාහිත්‍යය | 26 (54%) | 30 (41%) |
| විශ්ලේෂණය හා අවබෝධය | 35 (65%) | 40 (21%) |




I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සැකසීමේදී පදනම් කරගනු ලැබූ තේමා හතර අතරින්, පහසුතාව වැඩිම තේමාව භාෂා කුසලතාව වන අතර එහි පහසුතාව 56% කි; පහසුතාව අඩුම තේමාව ව්‍යාකරණ වන අතර එහි පහසුතාව 44% කි.

සමස්ත වශයෙන් I ප්‍රශ්න පත්‍රයෙහි පහසුතාව 50.33% කි.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තේරූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය |
| 1 | 2 | 13% | 75% | 10% | 2% |
| 2 | 3 | 24% | 10% | 59% | 7% |
| 3 | 1 | 71% | 3% | 51% | 21% |
| 4 | 2 | 2% | 88% | 7% | 3% |
| 5 | 3 | 13% | 12% | 45% | 30% |
| 6 | 4 | 13% | 34% | 13% | 40% |
| 7 | 2 | 53% | 19% | 21% | 7% |
| 8 | 4 | 6% | 25% | 9% | 59% |
| 9 | 1 | 41% | 19% | 27% | 13% |
| 10 | 3 | 17% | 27% | 34% | 22% |
| 11 | 3 | 9% | 18% | 50% | 23% |
| 12 | 3 | 11% | 37% | 35% | 17% |
| 13 | 4 | 36% | 15% | 17% | 32% |
| 14 | 1 | 44% | 12% | 36% | 8% |
| 15 | 2 | 14% | 74% | 2% | 10% |
| 16 | 1 | 39% | 18% | 18% | 25% |
| 17 | 3 | 21% | 17% | 39% | 23% |
| 18 | 2 | 6% | 86% | 4% | 4% |
| 19 | 2 | 16% | 50% | 17% | 17% |
| 20 | 2 | 5% | 59% | 8% | 28% |
| 21 | 1 | 85% | 3% | 10% | 2% |
| 22 | 2 | 5% | 85% | 8% | 2% |
| 23 | 3 | 6% | 27% | 63% | 4% |
| 24 | 4 | 12% | 11% | 13% | 64% |
| 25 | 1 | 40% | 42% | 10% | 8% |
| 26 | 2 | 19% | 54% | 16% | 11% |
| 27 | 3 | 12% | 23% | 42% | 23% |
| 28 | 1 | 33% | 18% | 34% | 15% |
| 29 | 2 | 53% | 22% | 18% | 7% |
| 30 | 3 | 12% | 24% | 41% | 23% |
| 31 | 1, 2 | 24% | 25% | 27% | 24% |
| 32 | 2 | 44% | 24% | 11% | 21% |
| 33 | 1 | 28% | 27% | 25% | 20% |
| 34 | 1 | 53% | 10% | 18% | 19% |
| 35 | 3 | 5% | 15% | 65% | 15% |
| 36 | 4 | 7% | 34% | 15% | 44% |
| 37 | 2 | 22% | 40% | 5% | 33% |
| 38 | 1 | 60% | 15% | 7% | 18% |
| 39 | 4 | 6% | 26% | 8% | 60% |
| 40 | 1 | 21% | 24% | 24% | 31% |

සටහන : එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.
අංක 31 ප්‍රශ්නය සඳහා 1 හා 2 වරණ දෙකම නිවැරදි යැයි සලකන ලදී.

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

මෙවර සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයේ අඩංගු වූ බහුවරණ ප්‍රශ්න 40, භාෂා කුසලතා, ව්‍යාකරණ, භාෂා සාහිත්‍යය, විශ්ලේෂණය හා අවබෝධය යන තේමා යටතේ පහත සඳහන් පරිදි සැකසී තිබිණි.

- භාෂා කුසලතා පිළිබඳ ප්‍රශ්න : 1, 2, 3, 4, 5, 6, 7, 8, 11, 12, 13, 14, 15, 20, 21, 22, 23, 29
- ව්‍යාකරණ පිළිබඳ ප්‍රශ්න : 9, 10, 16, 17, 18, 19, 24, 25, 27, 28, 31, 32, 33
- භාෂා සාහිත්‍යය පිළිබඳ ප්‍රශ්න : 26, 30
- විශ්ලේෂණය හා අවබෝධය පිළිබඳ ප්‍රශ්න : 34, 35, 36, 37, 38, 39, 40

මෙම පත්‍රයෙහි වඩාත්ම පහසු ප්‍රශ්නය වූ අංක 4 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 88% ක් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර ඊළඟට පහසු ප්‍රශ්න වූ අංක 18 ප්‍රශ්නය සඳහා 86% ක් ද අංක 21 හා 22 ප්‍රශ්න සඳහා 85% බැගින් ද නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. ඉතිරි ප්‍රශ්න අතුරින් අංක 1, 3, 15, 23, 24 හා 35 යන ප්‍රශ්න සඳහා 60% කට වැඩි ප්‍රමාණයක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.
මෙම ප්‍රශ්න පත්‍රයෙහි දුෂ්කරම ප්‍රශ්නය වී ඇත්තේ අංක 7 ප්‍රශ්නය වන අතර එයට නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් 19% ක් පමණි. ඊළඟට දුෂ්කර ප්‍රශ්න බවට පත්ව තිබූ අංක 29 හා 40 ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ 21% ක් බැගින් පමණි. ඉතිරි ප්‍රශ්න අතුරින් අංක 6, 12, 13, 16, 17, 28, 32 හා 33 යන ප්‍රශ්න සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් 40% කට අඩු ප්‍රමාණයකි.

ඉහත නිරීක්ෂණ හා 20 වන පිටුවේ ඇති තොරතුරු ඇසුරෙන් පහත දැක්වෙන නිගමන හා යෝජනා ඉදිරිපත් කළ හැකිය.
6 වැනි ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූයේ සිවුවන වරණයයි. 40% ක් එය තෝරා තිබුණි. එහෙත් නිවැරදි පිළිතුර ලෙස දෙවන වරණය ද 34% ක් තෝරා තිබිණි. සිසුන් සැලකිය යුතු ප්‍රමාණයක් තුළ සාහිත්‍යමය වදන් පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති බව මෙයින් පෙනේ.
7 වැනි ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූයේ දෙවන වරණයයි. ඊට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 19% ක් පමණි. 53% ක් පමණ නිවැරදි පිළිතුර ලෙස තෝරා තිබුණේ පළමුවන වරණයයි. බොහෝ සිසුන් තුළ භාෂාමය පාරිභාෂික වදන් පිළිබඳ අවබෝධය දුර්වල බව මෙයින් පෙනේ.
8 වැනි ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූයේ සිවුවන වරණයයි. 59% ක් එය තෝරා තිබුණි. එහෙත් දෙවන වරණය ද 25% ක් තෝරා තිබුණි. පාරිභාෂික වදන් පිළිබඳව සිසුන්ගේ අවබෝධයෙහි ඌනතාවත් තැනට සුදුසු වචනය තෝරා ගැනීමෙහි අපහසුතාවත් මෙයින් පෙනේ.
10 වැනි ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූයේ තෙවන වරණයයි. එය තෝරා තිබුණේ 34% ක් පමණි. අනෙක් වරණ තුනට ද සැලකිය යුතු ප්‍රතිචාර සංඛ්‍යාවක් ලැබී තිබුණි. ඒ, පළමුවන වරණයට 17% ක් ද දෙවන වරණයට 27%ක් ද තෙවන වරණයට 34% ක් ද සිවුවන වරණයට 22% ක් ද වශයෙනි. අක්ෂර වින්‍යාසය පිළිබඳ ව බොහෝ සිසුන්ගේ දැනුම හා අවබෝධය ප්‍රමාණවත් නොවන බව මෙයින් පැහැදිලි වේ.
20 වැනි ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වූයේ දෙවන වරණයයි. 59% ක් පමණ එය තෝරා තිබුණි. එහෙත් 28% ක් පමණ සිවුවන වරණය ද තෝරා තිබුණි. සාම්ප්‍රදායික යෙදුම්වල අර්ථ අවස්ථාවෝචිතව ගළපා ගැනීමේ නොහැකියාවක් එයින් පෙනේ.
31 වැනි ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූයේ පළමුවන වරණයයි. එය තෝරා තිබුණේ 24% ක් පමණි. ඒ හා සමාන සංඛ්‍යාවක් අනෙක් වරණ තුන ද තෝරා තිබුණි. දෙවන වරණය 25% ක් ද තෙවන වරණය 27% ක් ද සිවුවන වරණය 24% ක් ද වශයෙනි. උක්තාඛ්‍යාත යෝග සම්බන්ධ විශේෂ රීති පිළිබඳ සිසුන්ගේ අඩු දැනුම හා අඩු අවබෝධය ඉන් පෙනේ.
ඉහත සලකා බලන ලද නිදසුන් ඇසුරෙන් නිගමනය කළ හැක්කේ ගුරු මහත්ම මහත්මීන් විසින් සාහිත්‍යමය යෙදුම්, සාහිත්‍යගත පාරිභාෂික වදන්, භාෂාමය පාරිභාෂික වදන්, අක්ෂර වින්‍යාසය හා උක්තාඛ්‍යාත යෝග සම්බන්ධ විශේෂ රීති වැනි ක්ෂේත්‍ර පිළිබඳව වැඩි අවධානයක් යොමුවන සේ සිසුන් දැනුම්වත් කළ යුතු බව ය. මාතෘකා පදනම් කරගත් හුදකලා පාඩම් ඉගැන්වීම වෙනුවට ඉගෙනුම් ක්‍රියාවලිය තුළ මෙම ක්ෂේත්‍ර කෙරෙහි ශිෂ්‍ය අවධානය වරින් වර යොමුවන ක්‍රියාකාරකම් සංවිධානය කිරීමත් එදිනෙදා භාවිත වන යෙදුම් ආශ්‍රිත නිදසුන් බහුලව යෙදෙන පරිදි සිසුන් සතතාභ්‍යාසවල නිරත කරවීමත් යෝග්‍ය බව ද අවධාරණය කළ යුතු වේ.

## 2.2 II ප්‍රශ්න පත්‍රය

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

1.ප්‍රශ්නය : භාෂා පරිචය ඇගයීම සඳහා සකස් කරන ලද කෙටි පිළිතුරු සැපයීමේ අනුප්‍රශ්න 10 කින් සමන්විත වේ.
එක් අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි.

2. ප්‍රශ්නය : නිර්දිෂ්ට ව්‍යුහගත තේමා හතරක් අතරින් එකක් තෝරාගෙන දෙන ලද වචන සීමාවක් යටතේ රචනයක් ලිවිය යුතු වේ. තෝරා ගනු ලැබූ රචනා ව්‍යුහයට වඩාත් අදාළ වන සාරවත් කරුණු හඳුනාගෙන නිර්මාණාත්මක ලෙස සංවිධානය කර ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 25 කි.

3. ප්‍රශ්නය : දෙන ලද පාඨයක සාරාංශය, දෙන ලද වචන සීමාවක් තුළ ලිවිය යුතු වේ. භාෂාමය සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.

4. ප්‍රශ්නය : දෙන ලද ඡේදයක් ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයිය යුතු වේ. අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.

5. ප්‍රශ්නය : දී ඇති අවශ්‍යතාවලට ගැළපෙන සේ අදාළ ඉල්ලීමක් අඩංගු ලිපියක් හෝ අදාළ තොරතුරු අඩංගු පුවත්පත් වාර්තාවක් හෝ ලිවිය යුතු වේ. ප්‍රායෝගික ලේඛන කුසලතා මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 15 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 80

අවසාන ලකුණු = $80 \div 2 = 40$

### 2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 2, 3, 4.1, 4.2 හා 4.3 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම

ව්‍යුහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ **දෙක** නම් කරන්න.

(අ) ඞ, ඤ, ණ, න, ම (ආ) ත, ථ, ද, ධ, න

(ii) **(අ)** සහ **(ආ)** වාක්‍යවල යෙදී ඇති **ගත** යන වචනයට තේරුම් දෙකක් ඇත. ඒ තේරුම් **දෙක** පමණක් වෙන් වෙන් ව ලියන්න.

**(අ)** **ගත** සිත සංවර කර ගනු පිණිස ඇය භාවනාවට යොමු වූවා ය.

**(ආ)** එම **ගත** කෝට්ටේ යුගයට අයත් වූවකි.

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය **සදෝෂ්‍ය. එම වචන දෙක පමණක් නිදෙස් කර** ලියන්න.

ශ්‍රී ලංකාවේ ඖෂධ භාවිතය සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව වෛද්‍ය පර්යේෂණ ආයතනය නිකුත් කළ වාර්තාවක සඳහන් වේ.

(iv) පහත දැක්වෙන එක් එක් වචන අයත්වන සන්ධි විධිය නම් කරන්න.

(අ) ජීවනෝපාය (ආ) පුනරුක්තිය

(v) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය දෙක **කර්මකාරක** වාක්‍ය බවට හරවා ලියන්න.

(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති. (ආ) ආදි ශිෂ්‍යයෝ අප පිළිගත්හ.

(vi) පහත දැක්වෙන (අ), (ආ) යෙදුම්වල පළමුවන වචනය සමඟ දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවන හෝ දෙවන හෝ වචනය සකස් කර ලියන්න.

(අ) විදෙස් ප්‍රවෘත්ති (ආ) වර්ෂා කල

(vii) පහත දී ඇති කවි පේළි දෙකෙහි **තද කළු අකුරෙන්** දැක්වෙන **ක්‍රියා වර්ගය** නම් කරන්න.

(අ) "**කියමින්** ගී රස මියුරු"

(ආ) "**යව** යි නෙරපුය යම පුරයට"

(viii) '**කර**' යන පදයට '**අටි**' ප්‍රත්‍යය එකතු කිරීමෙන් '**කරටි**' යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන්,

(අ) '**ඉග**' යන පදයට '**අටි**' ප්‍රත්‍යය එකතු කිරීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

'**සිසිල්**' යන පදයට '**අස්**' ප්‍රත්‍යය එකතු කිරීමෙන් '**සිසිලස්**' යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන්,

(ආ) '**වරල්**' යන පදයට '**අස්**' ප්‍රත්‍යය එකතු වීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

(ix) පහත සඳහන් වචන දෙකෙහි **අනුක්ත රූප** ලියන්න.

(අ) සත්තු (ආ) ශිෂ්‍යාවක්

(x) කමත් බසෙහි **ගවයා** හා **කුල්ල** හැඳින්වීමට යෙදෙන විශේෂිත වචන ලියන්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

අපේක්ෂිත පිළිතුර

i (අ) නාසිකාක්ෂර / අනුනාසිකාක්ෂර / නාසික්‍යාක්ෂර / අනුනාසික්‍යාක්ෂර / නාසික්‍ය / අනුනාසික්‍ය / වර්ගාන්තාක්ෂර / වර්ගාන්ත

(ආ) දන්තජ / 'ත' වර්ගය / තවර්ගාක්ෂර

ii (අ) ශරීරය / සිරුර / කය / ඇඟ / වෙර

(ආ) ග්‍රන්ථය / පොත / පුස්තකය / කෘතිය

iii ඖෂධ, ශීඝ්‍රයෙන්

iv (අ) ස්වරාදේශ සන්ධිය

(ආ) ආගම සන්ධිය / ස්වර සන්ධිය

v (අ) වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කරනු ලබත / කරනු ලබත් / කරනු ලැබෙති / කෙරෙත් / කෙරෙති.

(ආ) ආදි ශිෂ්‍යයන් විසින් අපි පිළිගැනුණෙමු / පිළිගන්නා ලදිමු / පිළිගන්නා ලද්දෙමු / පිළිගනු ලැබීම / පිළිගනු ලැබූමු / පිළිගන්නා ලදුමහ.

vi (අ) විදෙස් පුවත් / විදේශ ප්‍රවෘත්ති

(ආ) වර්ෂා කාලය / වැසි කල

vii (අ) මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය
(ආ) විධි ක්‍රියා / විධාන ක්‍රියා / විදිකිරිය

viii (අ) ඉඟටි
(ආ) වරලස්

ix (අ) සතුන්
(ආ) ශිෂ්‍යාවක

x අම්බරුවා, යතුර

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ 98% ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 00-05 ප්‍රාන්තරයෙහි 20%ක් ද ලකුණ 06-10 ප්‍රාන්තරයෙහ 34%ක් ද ලකුණ 11-15 ප්‍රාන්තරයෙහි 29%ක ද ලකුණු 16-20 ප්‍රාන්තරයෙහි 17%ක් ද ලකුණු ලබා ගෙන ඇත.




ප්‍රශ්නයෙහි කොටස් 10 ට අයත් අනුකොටස් 18 ක් ඇති අතර, ඒවා අතුරෙන් (ii) (අ), (viii) (අ), (viii) (ආ) අනුකොටස්වල පහසුතාව 0.8 ට වඩා වැඩි වන අතර, (v) (ආ) අනුකොටසෙහි පහසුතාව 0.2 ට ද වඩා අඩු වේ.

කෙටි ප්‍රශ්න 10 කින් හා ඒවායේ අනුකොටස් 18 කින් යුතු 1 ප්‍රශ්නයෙහි (vii) 'ආ' කොටස සඳහා 92% ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. එය මෙම ප්‍රශ්නයෙහි පහසුතාව වැඩිම අනුකොටසයි. එම ප්‍රශ්නයේම 'අ' කොටසට 86% ක් ද (ii) ප්‍රශ්නයේ 'අ' කොටසට 83% ක් ද නිවැරදි පිළිතුරු සපයා තිබුණි. ඒ අනුව එම කොටස්වල ද පහසුතා වැඩි බවක් පෙන්වයි. මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩුම අනුකොටස වුයේ 18% ක් පමණක් නිවැරදි පිළිතුරු සපයා තිබූ (v) ප්‍රශ්නයේ 'ආ' කොටසයි. එහිම 'අ' කොටසටත් (iv) වන ප්‍රශ්නයේ 'අ' හා 'ආ' කොටස් දෙකටමත් සාර්ථකව පිළිතුරු සපයා තිබුණේ 30% කට අඩු සංඛ්‍යාවකි. ඒ අනුව එම කොටස් ද පහසුතා අඩුබවක් පෙන්වයි. (iv) හා (v) ප්‍රශ්න සඳහා සාර්ථක පිළිතුරු අඩු සංඛ්‍යාවක් සපයා තිබීමෙන් ගම්‍ය වනුයේ කර්තෘ කාරක වාක්‍ය, කර්ම කාරක වාක්‍ය හා සිංහල භාෂාවේ ප්‍රධාන ව්‍යාකරණ අංගයක් වන 'සන්ධි' පිළිබඳව සිසුන්ගේ දැනුම හා අවබෝධය දුර්වල මට්ටමක පැවති බව ය.

02 ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්මාණාත්මක හැකියාව, විශ්ලේෂණය හා භාෂා භාවිතය පිළිබඳ දැනුම මැනීම මෙහිදී අපේක්ෂා කෙරේ. දෙනු ලබන කෙටි හැඳින්වීම පාදක කොටගෙන නිර්දිෂ්ට වචන සංඛ්‍යාව නොඉක්මවා නිර්මාණාත්මක රචනාවක් ලිවීමේ හැකියාව මෙහිදී අවශ්‍ය වේ. දීර්ඝ විස්තර සංශ්ලේෂණය කිරීමේ හැකියාව ද මෙහිදී සොයා බැලේ. එසේම කරුණු විශ්ලේෂණය කරමින්, යෝග්‍ය පරිදි ඡේද හා අනුඡේදවලට බෙදා ඉදිරිපත්කර තිබීම ද අපේක්ෂිත ය. මේ කරුණු දැක්වීම විශ්ලේෂණාත්මක විය යුතුය. රචනයේ ආරම්භය, මධ්‍යය හා අවසානය අතර මනා ගැළපීමක් තිබීම අවශ්‍ය ය. අපේක්ෂකයන්ගේ භාෂා භාවිතය පිළිබඳව පවත්නා හැකියාව ද මෙහිදී සොයා බැලේ. මේ අනුව අක්ෂර වින්‍යාසය, පද හා වාක්‍ය භාවිතය පිළිබඳ දැනුම ද පරීක්‍ෂා කෙරේ.

ව්‍යූහය : මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මයයි. එනම් පරීක්ෂකයා ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීමයි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි තිබිය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබාගත හැකිය. මාතෘකාවක් ඉදිරිපත් කොට නැතත්, අදාළ විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

**2.** පහත දැක්වෙන අ. ආ. ඉ. ඊ යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන වචන **250** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඊ සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යයෙන් අනූන රටකි. වනාන්තර, දිය ඇලි, මුහුදු වෙරළ වැනි දර්ශනීය ස්ථානවලින් අලංකාරවත් වී ඇත. එහෙත් මේවා නැරඹීමට පැමිණෙන ජනයා විසින් ඒ ස්ථානවලට බැහැර කෙරෙන පොලිතින් හා ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය හේතුවෙන් ඒ තැන්වල සුන්දරත්වය වැනසෙමින් පවතී. මේ තත්ත්වය වළක්වාගැනීම කෙරෙහි කාගේත් අවධානය යොමු විය යුතු ය.

(ආ) අනාදිමත් කාලයක පටන් රටක පැවතගෙන එන්නා වූ ජාතික හා ආගමික උත්සව මගින් එරට සංස්කෘතියේ වැදගත් පැතිකඩක් නිරූපණය කෙරෙයි. ශ්‍රී ලාංකිකයන් අතර පැවැත්වෙන එම උත්සවවල දක්නට ලැබෙන සංස්කෘතික වටිනාකම ද ඉහළ ය. ජනයා අතර සාමය, සාමූහිකත්වය හා සහජීවනය ගොඩනැගීමට ද ඒ උත්සව මගින් මහඟු පිටුබලයක් සැපයෙයි.

**(ඉ) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමට ලොව සෑම රටක් ම බැඳී සිටිය ද ළමයින් මෙහෙකරු සේවයේ යෙදවීම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල පවතින ප්‍රබල සමාජ ගැටලුවකි. ළමා ශ්‍රමිකයන් මෙවැනි විවිධ අපයෝජනවලට ලක්වීම් හා ඔවුන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පුවත් නිතර වාර්තා වේ. නොයෙක් සමාජ-ආර්ථික හේතු මත උද්ගත වී ඇති මේ ප්‍රශ්නය විසඳීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.**

**(ඊ) වර්තමාන ශ්‍රී ලාංකිකයන් වැඩිදෙනකුගේ සමීපතම රූපවාහිනී වැඩසටහන බවට පත්ව තිබෙන්නේ ටෙලිනාට්‍යයි. මේවායින් බහුතරයක් කලාත්මක බවින් හීන හරසුන් ඒවා බව විචාරකයෝ පවසති. එබැවින් ටෙලිනාට්‍ය ආධ්‍යාපනික, සෞන්දර්යාත්මක හා ගුණාත්මක අරමුණු සමග සබැඳි විනෝදස්වාදාත්මක මාධ්‍යයක් බවට පත් කිරීම කාලීන අවශ්‍යතාවකි.** ( ලකුණු 25 යි )

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ) ස්වභාව සෞන්දර්යයෙන් අනූන රටක් ගොඩ නගමු.

(ආ) ජාතික හා ආගමික උත්සවවලින් පිළිබිඹු වන සංස්කෘතිය හා එහි වැදගත්කම

(ඉ) අවධානය යොමුකළ යුතු ළමා අයිතිවාසිකම්

(ඊ) කලාත්මක හා ගුණාත්මක බවින් පෝෂණය විය යුතු ටෙලි නාට්‍යය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.

| | | |
|---|---|---|
| 1. | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | ලකුණු 08 යි |
| 2. | සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | ලකුණු 12 යි |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | ලකුණු 05 යි |

01. සාරවත්භාවය — ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම — ලකුණු 01 යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරු බව හා සම බව, වචන ගණන 250 ට සමීපව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය — ලකුණු 12 යි

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම — ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




මෙය ද අනිවාර්ය ප්‍රශ්නයකි. එහෙත් පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 97% ක් පමණ වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25 ක් හිමිවේ.
ඉන් ලකුණු 00-06 ප්‍රාන්තරයෙහි 6%ක් ද
ලකුණු 07-12 ප්‍රාන්තරයෙහි 19%ක් ද
ලකුණු 13-18 ප්‍රාන්තරයෙහි 48%ක් ද
ලකුණු 19-25 ප්‍රාන්තරයෙහි 27%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය, දී ඇති රචනා ව්‍යූහ හතරකින් යුක්ත විය. ඒවා අතරින් එක් රචනා ව්‍යූහයක් පමණක් තෝරාගෙන රචනයක් ලිවිය යුතු වූ අතර එම එක් එක් ව්‍යූහය පදනම් කරගෙන ලියන ලද රචනාවලට ලකුණු පිරිනමා ඇති ආකාරය අනුව එම රචනා ව්‍යූහවල පහසුතා පිළිවෙළින් 58%, 28%, 46% හා 45% විය.

සමස්තයක් ලෙස ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම සාර්ථක මට්ටමක පැවතිණි. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 25 අතුරින් හරි අඩකට එනම් ලකුණු 13 ට වඩා වැඩියෙන් ලබා තිබූ ප්‍රමාණය 75% කි. ලකුණු 13 ට වඩා අඩුවෙන් ලබා තිබුණේ 25% කි. ඉන් 6% ක් ඉතා අඩු මට්ටමක පැවතුණි. වඩාත් සාර්ථක පිළිතුරු වැඩියෙන් දක්නට ලැබුණේ (අ) කොටස සඳහා සැපයුණු පිළිතුරු අතර ය. (ආ) කොටස තෝරාගත් අපේක්ෂකයින්ගේ පිළිතුරු එතරම් සාර්ථක බවක් නොපෙනේ.

රචනා ලිවීමේ නිපුණතාව සිසුන් තුළ තව තවත් වර්ධනය කළ යුතුය. එමගින්, නිර්මාණාත්මක අදහස් ජනනය කරවීමේත්, ස්වකීය අදහස් විධිමත්ව හා සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමේත් කුසලතාව වර්ධනය වීමත් වාං මාලාව පෝෂණය වීමත් සිදුවන බැවිනි. එහෙයින් සිසුන් ලවා නිරන්තරව රචනා ලියවිය යුතුය. අතිරේක පොත් පත් කියවීම, සාර්ථක රචනා ලිවීමට මහගු අත්වැලක් බව සිසුන්ට අවධාරණය කළ යුතුය. දෙනු ලබන මාතෘකාවක් පිළිබඳ අදහස් තර්කානුකූලව, අර්ථවත්ව, නිර්මාණාත්මකව හා සංවිධානාත්මකව ඉදිරිපත් කළ හැකි අයුරුත් ශිල්පීය දක්ෂතා තුළින් ඒවා තවත් ක්‍රමානුකූල හා අර්ථවත් කළ හැකි අයුරුත් සිසුන්ට පෙන්වා දීම වැදගත් ය.

II පත්‍රයට වෙන් කර ඇති ලකුණු 80 න් වැඩිම ලකුණු ප්‍රමාණයක් එනම් ලකුණු 25 ක් ම හිමිවන්නේ අංක 2 ප්‍රශ්නය සඳහා වන පිළිතුරටයි. එනම් දෙන ලද විස්තරයට හෙවත් රචනා ව්‍යුහයට අනුව ලියනු ලබන රචනයටයි. දී තිබූ ව්‍යුහ පාදක කරගෙන ලියන ලද රචනා හතර අතරින් අඩුම මට්ටමින් ලකුණු ලබාගෙන ඇත්තේ (ආ) ව්‍යුහය පාදක කර ගන්නා ලද රචනයයි. එබැවින් සිසුනට මග පෙන්වීමක් ලෙස එම ව්‍යුහය පාදක කරගෙන ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික උත්සව යන මාතෘකාව යටතේ ලියන ලද රචනයක්, ආදර්ශයක් ලෙස පහත දැක්වේ.

**ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික උත්සව**

**අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික උත්සව පවත්නා බව පැහැදිලි කරුණකි. මේ උත්සව මගින් ශ්‍රී ලාංකිකයන්ගේ සංස්කෘතික හර පද්ධතිය ද අනන්‍යතාව ද පිළිබිඹු කෙරේ. එසේම ජනයා අතර සාමය, සාමූහිකත්වය හා සහජීවනය ගොඩනැගීමට ද මේ උත්සව මගින් පිටිවහලක් ලැබෙයි.**

**ශ්‍රී ලංකාවේ ජාතික උත්සව අතර අලුත් අවුරුදු උත්සවය හා නිදහස් උත්සවය වැදගත් තැනක් ගනී. අලුත් අවුරුදු උත්සවය පැවැත්වෙන්නේ අප්‍රේල් මාසයේදී ය. සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය වීමත් සමග මේ උත්සවය ආරම්භ වේ. එසේම ගොවිහු තම අස්වනු රැස් කොට ඒවායේ අග්‍ර භාගය දෙවියන් උදෙසා පිරිනැමීමටත් නෑදෑ හිතවතුන් සඳහා සංග්‍රහ කිරීමටත් මේ කාලය තුළ බලාපොරොත්තුවෙන් සිටිති. දින ගණනක් පුරා ඇදී යන අවුරුදු උත්සවය කාටත් ප්‍රියජනක අවස්ථාවකි. ලොකු කුඩා කවුරුත් විවේකීව කාලය ගත කරමින්, ආහාර අනුභව කරමින්, නෑදෑ හිතමිතුරන්ට සංග්‍රහ කරමින්, ක්‍රීඩාවල යෙදෙමින් හා ආගමික වතාවත් සිදු කරමින් කාලය ගත කරත්. අලුත් අවුරුදු උත්සවයේදී ජීවිතයේ නව ආරම්භයක් ඇතිව කටයුතු කිරීමට ද බොහෝ දෙනා උත්සුක වෙති. ශ්‍රී ලංකාවේ පැරණි සංස්කෘතියත් ආදි මුතුන් මිත්තන්ගේ චින්තන ධාරාවත් හෙළි කෙරෙන අවස්ථාවක් ලෙස අලුත් අවුරුදු උත්සවය හැඳින්විය හැකිය.**

**නිදහස් උත්සවය ජාතික උත්සව අතර ඉතා සුවිශේෂ වූවකි. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලැබීම සිහිපත් කිරීම සඳහා සෑම අවුරුද්දකම පෙබරවාරි හතර (04) වැනි දින මේ උත්සවය පැවැත්වේ. ජාති හෝ ආගම් භේදයකින් තොරව සෑම ශ්‍රී ලාංකිකයකුම මේ උත්සවය සැමරීමට ඉදිරිපත් වන බව පෙනෙයි. එදින මුළු දිවයිනම ජාතික ධජයෙන් අලංකාරවත් වේ. ජාතික අභිමානය, ප්‍රෞඪත්වය හා අනන්‍යතාව මෙහිදී ශ්‍රී ලාංකිකයන් තුළ ඉස්මතු වී පෙනෙයි.**

**ශ්‍රී ලංකාවේ පවතින ආගමික උත්සව අතර බෞද්ධයන් විසින් පවත්වනු ලබන වෙසක් උත්සවය කැපී පෙනේ. බෞද්ධයන්ගේ ආගමික ශාස්තෘවරයා වන බුදුන්වහන්සේගේ උපත, බුද්ධත්වයට පත්වීම සහ පරිනිර්වාණය සැමරීම වෙසක් උත්සවයේ මූලික අභිප්‍රායයි. වෙසක් උත්සවය බෞද්ධයන් ආමිස හා ප්‍රතිපත්ති පූජා කෙරෙහි යොමු කරවන හා ඔවුන් අතර සහජීවනය වර්ධනය කරවන ආගමික උත්සවයක් වශයෙන් හඳුනාගත හැකිය.**

**බෞද්ධයන්ගේ ආගමික උත්සව අතර පොසොන් උත්සවයට ද විශේෂ ස්ථානයක් හිමි වේ. මිහිඳු මහරහතන් වහන්සේ බුදුදහම රැගෙන ශ්‍රී ලංකාවේ මිහින්තලයට වැඩම කරවීමේ ඓතිහාසික සිද්ධිය සිහිපත් කිරීම පොසොන් උත්සවයේ පරමාර්ථයයි. ශ්‍රී ලංකාවේ වෙහෙර විහාර, ප්‍රතිමා හා චිත්‍ර වැනි විවිධ වූ ආගම් විෂයක ගොඩනැගිලි හා කලා ශිල්ප බිහිවීම හා විශාල ප්‍රමාණයේ වැව් ඉදිකොට කෘෂිකර්මාන්තය මෙරට ප්‍රධාන ජීවනෝපාය මාර්ගය බවට පත්වීම සිදුවූයේ මහින්දාග මනයේ ප්‍රතිඵලයක් වශයෙනි. ඇසළ උත්සවය ද මෙබඳු ම සංස්කෘතික හා ආගමික වටිනාකමක් සහිත බෞද්ධයන්ගේ ආගමික උත්සවයකි. ඇසළ මාසයේ දී පැවැත්වෙන උත්සව අතර දළදා පෙරහැර ඉතා අලංකාරවත්ව පැවැත්වෙන්නකි. ශ්‍රී ලංකාවේ අතීත සංස්කෘතික හර පද්ධතිය මේ පෙරහැර මගින් නිරූපණය වේ.**

**ක්‍රිස්තු භක්තිකයන්ගේ උත්සව අතර නත්තල් හා පාස්කු උත්සව වැදගත් වෙයි. ක්‍රිස්තුස් වහන්සේගේ උපත මෙන්ම ජීවිතය හා සම්බන්ධ වන කුරුසියේ ඇණ ගැසීම, මළවුන් අතරින් නැගිටීම වැනි සිදුවීම් ද පාදක කොට ගෙන මේ උත්සව පැවැත්වේ. ක්‍රිස්තු ධර්මය තුළින් නිරූපිත සංස්කෘතික අනන්‍යතාව මෙහිදී ප්‍රදර්ශනය කෙරේ.**

**හින්දු ආගමික උත්සව අතර තෛපොංගල් උළෙල ඉතා වැදගත් කොට සැලකිය හැකිය. සූර්ය දේව වන්දනය මෙහිදී අපේක්ෂිත ය. හින්දු ආගමික චාරිත්‍රානුකූලව නව උපත දිවියක් ආරම්භ කිරීමට පියවර තැබීම ද මෙහිදී සිදු වේ. අලුත් අවුරුදු උත්සවයේදී ද හින්දු භක්තිකයන්ගේ දායකත්වය නොමඳව ලැබෙයි. මෙමගින් සිංහල, දෙමළ ජනවර්ග අතර සහයෝගිතාවට ද රුකුළක් ලැබේ.**

**ඉස්ලාම් භක්තිකයන්ගේ උත්සව අතර රාමදාන්/රාමසාන් උත්සවය විශේෂයෙන් වැදගත් වේ. හඳ බැලීම මුල් කොට ගෙන මේ උත්සවය පැවැත්වෙන බව කිව හැකිය.**

**මේ අනුව ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික උත්සව බොහෝ සංඛ්‍යාවක් පවත්නා බව පැහැදිලි ය. මේ උත්සව සඳහා සහභාගිවීම තුළින් අන්‍යෝන්‍ය අවබෝධය ලබා ගැනීමත් සහජීවනය හා සාමූහිකත්වය ගොඩනැංවීමත් කළ හැකිය.**

03 ප්‍රශ්නය

අපේක්ෂණය : දී ඇති ඡේදයක් කියවා, එහි අඩංගු විස්තර වර්ණනා බැහැර කරමින්, ඡේදයෙහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය කැටි කොට තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහිදී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

**3.** පහත දක්වෙන පාඨය වචන **50-60** අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන ද උත්තරය අග ලියන්න.

ජනශ්‍රැති යනුවෙන් අප හඳුන්වනු ලබන ජන සම්ප්‍රදායයන් සියල්ල තුළින් මූලිකව ම සිදු කරනු ලැබ ඇත්තේ එක් පරම්පරාවක් විසින් ලබා ගන්නා ලද සමස්ත දැනුම් පද්ධතිය ඊළඟ පරම්පරාව සඳහා උරුම කොට දීම ය. මෙම දැනුම් සම්භාරය යනු එක අංශයක එක පැතිකඩක් පමණක් සම්බන්ධ වූ ඒවා නොවී ය. එහෙයින් කුමන ජනශ්‍රැතියක් විශ්ලේෂණයට භාජනය කරනු ලැබුවත් යම් අංශයක් හා බැඳි දැනුම් ඒ වටා ගොනු වී ඇති බව දැකිය හැකි වනු ඇත. මින්නේරිය වැව වේවා, කලා වැව වේවා, සොරබොර වැව වේවා ආශ්‍රය කොට ගත් ජනප්‍රවාද සලකා බැලූ කල්හි ඒවායෙහි විනිවිද දැකිය හැක්කේ පැරැන්නන් වැව් බැඳීම සඳහා යෝග්‍ය ස්ථාන නිශ්චිත කොටගැනීම පාදක කොටගත් කරුණු ය. වැව් බැඳීම සඳහා යොදගත් තාක්ෂණික ක්‍රමවේදයන් ය. අනුගමනය කළ සිරිත් විරිත් ය. ඉටු කරන ලද පුද පිළිවෙත් ය. අනුරාධපුරය වේවා, පොළොන්නරුව වේවා, දඹදෙණිය වේවා, අගනුවර ඇසුරු කොටගත් ජනප්‍රවාද මගින් අපට ආරක්ෂා සහිත ජයග්‍රාහී රාජකීය අගනුවරක් ඉදි කිරීම සඳහා යෝග්‍ය තැන් සොයාගැනීමට යොද ගත් දැනුම් සම්භාරය මෙන් ම එම නගර ඉදි කිරීම සඳහා කරන ලද සැලසුම් හා උපයෝගි කොටගත් ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ලද හැකි ය. ( ලකුණු 10 යි )

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි

| | | |
|---|---|---|
| අන්තර්ගතය | : | ප්‍රධාන අදහස් සඳහා ලකුණු 05 යි. |
| වචන ගණන | : | ලකුණු 03 යි (වචන 50 - 60 අතර තිබීම සෑහේ) |
| ශිල්පීය දක්ෂතා | : | ලකුණු 02 යි (වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ ආදිය) |

අපේක්ෂිත ප්‍රධාන අදහස්

- ★ ජනශ්‍රැතිය යනු පරම්පරාවෙන් පරම්පරාවට දැනුම උරුම කිරීමේ කාර්යයයි.
- ★ සෑම ජනශ්‍රැතියකම පාහේ යම් අංශයක් හා බැඳි දැනුම් සම්භාරය එකට ගොනු වී ඇත.
- ★ වාපි කර්මාන්තය ආශ්‍රය කරගත් ජනප්‍රවාදවල, පැරැන්නන් වැව් බැඳීමට පාදක කොටගත් කරුණු සඳහන් වේ.
- ★ ආරක්ෂිත රාජධානි පිහිටුවා ඇත්තේ ද නගර ඉදිකිරීම සඳහා කළ සැලසුම් හා යෝග්‍ය තැන් සොයාගැනීම පිළිබඳ දැනුම ඇසුරෙනි.
- ★ මෙහි දී යොදාගත් තාක්ෂණික ක්‍රමවේද, අනුගමනය කළ සිරිත් විරිත්, ඉටුකරන ලද පුද පිළිවෙත් පිළිබඳ අවබෝධයක් ලැබේ.

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45ට අඩුවන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනැමේ. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබීම වුව ද පිළිගන්නා ලදී. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි. වචන ගණනයේදී ලිහිල් පිළිවෙතක් අනුගමනය කෙරිණි. වචන ගණන දළ වශයෙන් 60ට වැඩිවන කල්හි හෝ 45 ට අඩුවන කල්හි වචන ගණන සඳහා 01 (එක) ලකුණක් පිරිනමන ලදී.

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




තුන්වන ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයකි. එහෙත් මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති ප්‍රතිශතය 95% ක් පමණ වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 00-02 ප්‍රාන්තරයෙහි 4% ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයෙහි 17% ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයෙහි 37% ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයෙහි 42% ක් ද
ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනැමෙයි. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 10කි. ඒ අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන් ලැබූ ලකුණුවල මධ්‍යනය 7 ක්, එනම් ප්‍රශ්නයට හිමි ලකුණුවලින් 70% ක් වේ.

සාරාංශය ලිවීමේ ප්‍රශ්නයට ලකුණු ලබාගෙන තිබූ ආකාරය සතුටුදායක විය. සාර්ථකව පිළිතුරු ලියා තිබූ, එනම් ප්‍රශ්නයට හිමි ලකුණුවලින් හරි අඩකට වඩා ලබා තිබූ සංඛ්‍යාව 79% ක් පමණ විය. එහෙත් 4% ක් ඉතා දුර්වල මට්ටමක පැවතිණ.

ඡේදයක් කියවා එහි ඇති වර්ණනා හා අතුරු අදහස් බැහැර කොට මූලික හරය පමණක් මතුකිරීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කළ යුතුය. එමෙන්ම නිවැරදිව සාරාංශ ලිවීමේ ක්‍රම ශිල්ප ද සිසුන්ට හුරු කළ යුතුය.

අපේක්ෂිත සාරාංශය පිළිබඳව පැහැදිලි අදහසක් ලබාදීමේ අරමුණින් ලියන ලද සාරාංශයක ආදර්ශයක් පහත දැක්වේ.

**සාරාංශය**

**ජනශ්‍රැතියෙන් කෙරෙන්නේ පාරම්පරිකව දැනුම උරුමකරදීමයි. ජනශ්‍රැතියක් විශ්ලේෂණයේදී එක් අංශයකට අදාළ සියලු දැනුම් සම්භාරය ගොනු වී ඇති ආකාරය පෙනෙයි. පැරැන්නන් වැව් බැඳීමට උචිත ස්ථාන නිශ්චය කළ ආකාරයත් අනුගමනය කළ තාක්ෂණික ක්‍රමවේද, සිරිත් විරිත්, පුදපිළිවෙත් ආදියත් වැව් ආශ්‍රිත ජනප්‍රවාදවල නිරූපිතය. ආරක්ෂිත රාජධානියක් ඉදිකිරීමට භාවිත දැනුම් සම්භාරය, සැලසුම් හා ක්‍රමවේද පිළිබඳ තොරතුරු ලක්දිව පැරණි රාජධානි ආශ්‍රිත ජනප්‍රවාදවලින් හෙළිවෙයි.**

04 ප්‍රශ්නය

අපේක්ෂණය : ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

සාහිත්‍යය පරාර්ථය උදෙසා කැපවූවකි. සාහිත්‍යකරුවා තම අදහස් තමා තුළ ම තබා නොගෙන අන්‍යයන් වෙත පමුණුවන්නේ එහෙයිනි. මේ කාර්යයෙහි ලා තිදෙනෙක් දයකවෙති. ඒ ලේඛකයා, පාඨකයා හා විචාරකයා ය. ලේඛකයා තම මනසට පිවිසෙන අදහස්, අනුභූතියෙන් හෝ කල්පනයෙන් හෝ ලේඛනගත කරයි. එම කාර්යයෙහි ලා ඔහු සතුව පවතින සියුම් බව හා පරිණත බව මත සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලිත්වය පිවිසේ. පාඨකයා තමන් සතු රුචිය හෝ පළපුරුද්ද හෝ අනුව එය කියවයි. විචාරකයා කෘතියෙහි අන්තර්ගතය පිළිබඳ විමසා බලයි. එහිදී ඊට අයත් විෂය ක්ෂේත්‍රය, භාෂාව, ශෛලිය හා ආකෘතිය වැනි ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙයි. විචාර කාර්යයේ දී මෙකී ලක්ෂණ පිළිබඳ ව පමණක් නොව අත්දැකීමෙන් ලබාගත් සමාජ පරිඥානය ද වැදගත් වේ. මෙහි අත්දැකීම යනුවෙන් ගැනෙන්නේ පතපොත කියවීමෙන් ගොඩනගා ගත් බහුශ්‍රැතභාවය යි. බහුශ්‍රැතභාවයෙන් හිස් වූ විචාරකයකුට කෘතියක් අවතක්සේරු කිරීමත් අධිතක්සේරු කිරීමත් ඉතා පහසු ය. මේ ක්‍රම දෙකෙන් ම කෘතියට සාධාරණයක් ඉටු නො වේ.

(i) සාහිත්‍යය පරාර්ථය උදෙසා කැපවූවක් බව ලේඛකයා පවසන්නේ කුමක් නිසා ද?

(ii) සාහිත්‍යකරණය උදෙසා, දයකත්වය සපයන පුද්ගලයෝ කවරහු ද?

(iii) මෙම ඡේදයේ සඳහන් පරිදි සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලිත්වය පිවිසෙන්නේ ලේඛකයා සතු කවර ගුණාංග නිසා ද?

(iv) ලේඛකයා පවසන පරිදි කෘතියක් විචාරයට ලක් කිරීමේ දී විශේෂ අවධානය යොමු කෙරෙන කරුණු මොනවා ද?

(v) කෘතියක් අවතක්සේරු කිරීමත් අධිතක්සේරු කිරීමත් සිදුවන්නේ කෙබඳු විචාරකයකු අතින් ද?

( ලකුණු 10 යි )

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි
ප්‍රශ්න අංක (i) සිට (v) තෙක් ලකුණු 02 බැගිනි.

**අපේක්ෂිත පිළිතුරු**

i සාහිත්‍යකරුවා තම අදහස් අන් අය වෙත පමුණුවන නිසා

ii ලේඛකයා, පාඨකයා හා විචාරකයා

iii සියුම් බව හා පරිණත බව

iv අන්තර්ගතය, සමාජ පරිඥානය

(ඉහත උත්තර දෙකින් එකක් පමණක් ලියා ඇත්නම් ලකුණු 01 යි. එක් කරුණක් පමණක් විස්තර කර ඇත්නම් ලකුණු 01 යි.)

v බහුශ්‍රැත භාවයෙන් හීන වූ විචාරකයකුට

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




මෙය ද අනිවාර්ය ප්‍රශ්නයකි. එහෙත් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 93% ක් පමණ වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමි වේ.

ඉන් ලකුණු 00-02 ප්‍රාන්තරයෙහි 4% ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයෙහි 11%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයෙහි 21%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයෙහි 63%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 5 කින් යුක්ත වන අතර ඒ සියලු කොටස් සඳහා 50%ට වැඩියෙන් ලකුණු ලබාගෙන ඇත. තවද වැඩියෙන්ම ලකුණු ලබාගෙන ඇත්තේ (ii) වන කොටසට වන අතර එය 95%ක් පමණ වේ. අඩුවෙන්ම ලකුණු ලබාගෙන ඇත්තේ (iv) වන කොටසට වන අතර එය 57%ක් පමණ වේ.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සාර්ථක මට්ටමක පැවති බව පෙනේ. අවබෝධය පිළිබඳව විමසා තිබූ ප්‍රශ්න 5 න් හතරකටම 80% කට වඩා සාර්ථකව පිළිතුරු සපයා තිබිණි. නිර්දිෂ්ට පෙළපොත් මෙන්ම අනිර්දිෂ්ට ග්‍රන්ථ ද පරිශීලනය කිරීමට සිසුන් පෙලඹවිය යුතුය. ඒවායේ නිශ්චිත ඡේදයක හෝ ඡේද කිහිපයක අරුත් ක්ෂණිකව මතුකරගැනීමේ ශක්‍යතාව සිසුන් තුළ වර්ධනය කළ යුතුය.

## 05 ප්‍රශ්නය

අපේක්ෂණය : ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා ඇගයීම

5. රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බව ද ඊට සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කළ යුතු බව ද මොණරවිල දීප්ති යෞවන සමාජයේ මාසික රැස්වීමේ දී තීරණය කෙරිණි. යෞවන සමාජයේ ලේකම් වන තුෂාර වැලිවත්ත ඔබ යැයි සිතා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සිදුවන සේවය පිළිබඳ ව අවධාරණය කරමින් දනට ප්‍රජා ශාලාව පවතින භූමියේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසර ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.
**(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)** ( ලකුණු 15 යි )

**නැතහොත්**

සාහිත්‍ය මාසය නිමිති කොටගෙන සෙත්පුර මහා විද්‍යාලයේ වාර්ෂික කලා උළෙල 2011 සැප්තැම්බර් 10 සහ 11 දෙදින පුරා විදුහල් භූමියේ දී පැවැත්විණි. ගීරසවින්දනය හා පැරණි සාහිත්‍යයේ වටිනාකම පිළිබඳ විද්වත් දේශන දෙකක් ද විවිධ ප්‍රසංග ද, ආධ්‍යාපනික ප්‍රදර්ශනයක් ද ඇතුළු විශේෂාංග රාශියකින් සමන්විත වූ කලා උළෙල අවසන් වූයේ ඒ වෙනුවෙන් පැවැති භාෂා හා සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහකයන් හට ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදනය කිරීමෙනි. ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදනෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වූ පළාතේ ප්‍රවීණ කලාකරුවකු වූ කේ. බී. වෛද්‍යනාථ මහතා සාහිත්‍යය ඉගෙනීමේ වටිනාකම ගැන හරබර දෙසුමක් කළේ ය.
ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය වාර්තාකරු ඔබ යයි සිතා පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු වාර්තාවක් සකස් කරන්න. **(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)** ( ලකුණු 15 යි )

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

**රාජකාරි ලිපිය**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි

1. ආකෘතිය ලකුණු 04 යි
2. අන්තර්ගතය ලකුණු 08 යි
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි

1. ආකෘතිය (ලකුණු 04 යි)
   - යවන්නාගේ නම, තනතුර, ලිපිනය සහ දිනය ලකුණු 01 යි
   - ලබන්නාගේ ලිපිනය ලකුණු 01 යි
   - ආමන්ත්‍රණය ( මාතෘකාවට පෙර යොදා තිබිය යුතුය.) ලකුණු 01 යි
   - මාතෘකාව සහ අත්සන ලකුණු 01 යි

( යවන්නාගේ තනතුර, යවන්නාගේ ලිපිනය තුළ හෝ ලිපිය අවසානයේ හෝ සඳහන් වී තිබිය යුතුය. )

2. අන්තර්ගතය (ලකුණු 08 යි)
   - පුහුණු මධ්‍යස්ථානයක අවශ්‍යතාව ලකුණු 02 යි
   - නව ගොඩනැගිල්ලක අවශ්‍යතාව ලකුණු 02 යි
   - පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමෙන් ඉටුවන සේවය ලකුණු 02 යි
   - අවසර ඉල්ලීම ලකුණු 02 යි

3. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)
   - නිවැරදි අක්ෂර වින්‍යාසය, වියරණ, විරාම ලකුණු, පැහැදිලි අත් අකුරු, උක්තාඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම, සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන ලදී.

(ලකුණු 15 යි)

**පුවත්පත් වාර්තාව**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි

1. ආකෘතිය ලකුණු 04 යි
2. අන්තර්ගතය ලකුණු 08 යි
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි

1. ආකෘතිය (ලකුණු 04 යි)
   - ශීර්ෂය ලකුණු 02 යි
   - වාර්තාකරු ලකුණු 01 යි
   - වාර්තාවේ ආකර්ෂණීය භාවය ලකුණු 01 යි

2. අන්තර්ගතය (ලකුණු 08 යි)
   - නිමිත්ත ලකුණු 01 යි
   - දිනය ලකුණු 01 යි
   - ස්ථානය ලකුණු 01 යි
   - දේශන දෙකක් ලකුණු 01 යි
   - විවිධ ප්‍රසංගය ලකුණු 01 යි
   - ආධ්‍යාපනික ප්‍රදර්ශනය ලකුණු 01 යි
   - ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය ලකුණු 01 යි
   - ප්‍රධාන ආරාධිත අමුත්තා කේ.බී. වෛද්‍යනාථ මහතා ලකුණු 01 යි

3. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

- නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලකුණු, ඡේද වෙන් කිරීම සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන ලදී.

සටහන : නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් ලැබේ.

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන් ව දී එම ලකුණුවල එකතුව ලබා ගැනේ.

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නය ද අනිවාර්ය වන නමුත් තෝරාගෙන ඇත්තේ 91% ක් පමණි. ප්‍රශ්නය සඳහා ලකුණු 15 ක් හිමි වේ.
ඉන් ලකුණු 00-03 ප්‍රාන්තරයෙහි 5%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙහි 15%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙහි 38%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙහි 42%ක් ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත වේ. ඉන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. එම කොටස් දෙක අතරින් (අ) කොටසෙහි පහසුතාව 65%ක් ද (ආ) කොටසෙහි පහසුතාව 57%ක් ද වේ.

ප්‍රායෝගික ලේඛන ඇසුරෙන් සැකසුණු මෙම ප්‍රශ්නයට ද පිළිතුරු සැපයීම සතුටුදායක බවක් පෙන්වා ඇත. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව වන 15 න් 12 - 15 ප්‍රාන්තරයෙහි 43% ක් ද 8 - 11 ප්‍රාන්තරයෙහි 38% ක් ද ලබාගැනීමෙන් ඒ බව පැහැදිලි වේ. රාජකාරි ලිපියක් හෝ පුවත්පත් වාර්තාවක් මේ සඳහා ලිවිය යුතු විය. ඉන් රාජකාරි ලිපියක් ලිවීම වැඩි පහසුතාවක් පෙන්වා ඇත.

සිසුන් ප්‍රායෝගික ලේඛන පිළිබඳ අභ්‍යාසවල නිතර නිරත කළ යුතුය. රාජකාරි ලිපි මෙන් ම පුවත්පත් වාර්තා ද ලිවීමේ නිවැරදි රටා හුරු කළ යුතුය. ආකෘතිය, අන්තර්ගතය හා ශිල්පීය ලක්ෂණ යටතේ වැඩි ලකුණු ලබාගත හැකි ආකාරය ගැන සිසුන් දැනුවත් කළ යුතුය.

දී ඇති (අ) රාජකාරි ලිපියක් ලිවීම සහ (ආ) පුවත්පත් වාර්තාවක් සැකසීම යන කොටස් දෙකට සතුටුදායක ලෙස පිළිතුරු සැපයීම සඳහා නිරවුල් අවබෝධයක් ලබාගැනීම පිණිස ආදර්ශ රාජකාරි ලිපියක් සහ ආදර්ශ පුවත්පත් වාර්තාවක් පහත දැක්වේ.

රාජකාරි ලිපිය

තුෂාර වැලිවත්ත,
ලේකම්,
දීප්ති යෞවන සමාජය,
මොණරවිල.
2011.12.30

ප්‍රාදේශික ලේකම්,
මොණරවිල.

මහත්මයාණනි,

<u>නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවසර ලබාගැනීම</u>

මොණරවිල දීප්ති යෞවන සමාජයේ පසුගිය දා පැවති මාසික රැස්වීමේදී ගත් තීරණය අනුව රැකියා විරහිත තරුණ තරුණියන් උදෙසා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අපේක්ෂා කරමු. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට අපේක්ෂා කෙරෙන්නේ දැනට ප්‍රජාශාලාව තිබෙන භූමිභාගයේය. මෙම ගොඩනැගිල්ල මගින් ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයේ කාර්යභාරය පුළුල් වන අතර එමගින් රැකියා විරහිත තරුණ තරුණියන්ට ද ඉමහත් සේවයක් සැලසෙනු ඇත. මේ කරුණු ගැන සලකා යථෝක්ත භූමිභාගයේ නව ගොඩනැගිල්ලක් තැනීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලා සිටිමු. ගොඩනැගිල්ල සම්බන්ධ සැලැස්ම ද මේ සමග අමුණා ඇත.

ස්තූතියි.
මෙයට,
විශ්වාසී,

................................
තුෂාර වැලිවත්ත
ලේකම්
දීප්ති යෞවන සමාජය
මොණරවිල

පුවත්පත් වාර්තාව

සාහිත්‍යය ඉගෙනීම අගනා ජීවිතයක ආරම්භයයි.

සෙත්පුර ප්‍රාදේශික වාර්තාකරු

සෙත්පුර මහා විද්‍යාලයේ 2011 සැප් : 10 හා 11 දෙදින පැවති වාර්ෂික කලා උළෙලේ දී ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වූ ප්‍රවීණ කලාකරුවකු වන කේ.ඩී. වෛද්‍යනාථ මහතා සාහිත්‍යය ඉගෙනීමේ වටිනාකම ගැන කරුණු පැහැදිලි කරමින් ඉහත සඳහන් ප්‍රකාශය කළේය. පැරණි සාහිත්‍යය මෙන්ම නූතන සාහිත්‍යය ද ඉගෙනීමේ වැදගත්කම හෙළි කරමින් විද්වත් දේශකයෝ දෙදෙනෙක් ද හරවත් දෙසුම් ඉදිරිපත් කළහ.

වෛද්‍යනාථ මහතා තවදුරටත් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළේ සාහිත්‍යය ඉගෙනීම මගින් භාෂා භාවිතය පමණක් නොව පුද්ගල චරිත සංවර්ධනයක් ද ඇති වන බවයි. කවර විෂයයක් හදාරන අයකුට වුව ද සාහිත්‍යය පරිශීලනයෙන් ලැබෙන මානසික වින්දනයේ වැදගත්කම ගැන ඒ මහතා අවධාරණය කළේය.

මේ කලා උළෙලේ දී ගීත ගායනා, විවිධ ප්‍රසංග හා ආධ්‍යාපනික ප්‍රදර්ශන ඉදිරිපත් කෙරිණි. එසේ ම භාෂා සාහිත්‍ය තරගාවලියක් ද පැවැත්විණි. මේ තරගයේ ජයග්‍රාහකයන්ට ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කළේ ද වෛද්‍යනාථ මහතා ය. මේ උත්සවය උදෙසා පළාතේ විශාල පිරිසක් පැමිණ සිටියහ.

## 2.3 III ප්‍රශ්න පත්‍රය

### 2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 02 යි. මුළු ලකුණු** 80 කි.

| |
|---|
| නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කෙරිණි. 1, 2, 3, 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වූ අතර 5, 6, 7 ප්‍රශ්න අතුරෙන් තෝරාගත් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරිණි.<br><br>අංක 3 හා 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී තෝරාගැනීම සඳහා විකල්ප කොටස් දෙක බැගින් තිබිණ. |

### 2.3.2 III ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

III පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 5, 6 හා 7 ඇසුරෙන් සකස් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යුහය හා ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20යි.
මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක් කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

**1.** **(i)** සිට **(x)** තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ඕක තමා අර කවුද කීව වාගේ කරපු හොඳ පස්සෙන් එනව කියන්නෙ.
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) ඒ හා සබැඳි අවස්ථාව කුමක් ද?

(ii) තමන් බඩසා වුවහොත් බත් ලවාගෙන කන්ට කියව.
(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අය කවරෙක් ද?
(ආ) 'බඩසා' යන්නෙහි අර්ථය ලියන්න.

(iii) එවන මෙසඳ තැවුලිය ළැව් ගිනිසෙ **වලා**
කුමන සැප ද වින්දේ හිමි සමග **වලා**
(අ) මෙම කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අදහස වෙන් වෙන් ව ලියන්න.

(iv) කැරලුත් මහෝත්සාහයෙන් විද ගත් සිදුරුවලින් ගිරවුන් ප්‍රයෝජන විඳුනා සේ, මා රැස් කළ සම්පතින් ප්‍රයෝජන විඳින්නෝ බත් බැළයාණෝ ය.
මෙම පාඨයේ සඳහන්,
(අ) උපමාව, (ආ) උපමේය, වෙන්කොට දක්වන්න.

(v) (අ) සත්තුභත්ත ජාතක කථාව ඇසුරු කරගෙන ලියැවුණු කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?
(ආ) එම කෘතිය ලිවීම සඳහා ඇරයුම් කරන ලද්දේ කවරකු විසින් ද?

(vi) "එසේ හෙයින් මාරයාටත් වඩා රජදරුවන් **බලී** බව නොදනු ද යි ............. "
(අ) මෙම පාඨය උපුටා ගත් මුල් කෘතිය නම් කරන්න.
(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදයේ අර්ථය ලියන්න.

(vii) (අ) නාට්‍ය ශාස්ත්‍රය හා කාව්‍ය ශාස්ත්‍රය යන ග්‍රන්ථවලට අනුව නාට්‍යය බෙදූ ඇති කොටස් **දෙක** මොනවා ද?
(ආ) මහුල් ප්‍රස්තාව නාට්‍යය අයත් වන්නේ මෙයින් කුමන කොටසකට ද?

(viii) (අ) සඳ කිඳුරු දා කව ලියැවී ඇති සාහිත්‍ය යුගය නම් කරන්න.
(ආ) පූජාවලිය කෘතියේ රචකයා කවරෙක් ද?

(ix) (අ) ඒ.වී. සුරවීර මහතා විසින් රචිත කෙටි කතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.
(ආ) දයාසේන ගුණසිංහ මහතා විසින් රචිත කෙටි කතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.

(x) (අ) යසෝදරාවත හැරුණු විට මහනුවර යුගයේ ලියැවී ඇති කාව්‍ය ග්‍රන්ථ **දෙකක** නම් ලියන්න.
(ආ) තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් විසින් රචිත සංදේශ කාව්‍ය **දෙකක** නම් ලියන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

i (අ) සිරියාවතීගේ මව
(ආ) සිරියාවතීගේ මව සිරියාවතීට පාට පෙට්ටියක් ඉල්ලා ගැනීමට එන්සිනාලගෙ ගෙදර ගොස් එය නොලැබුණු නිසා ආපසු නිවසට පැමිණ දොස් කියන අවස්ථාව

ii (අ) සාකේත නුවර සිටුදේවියට පණිවිඩය ගෙන ආ තැනැත්තාට / තැනැත්තියට / තැනැත්තන්ට
(ආ) බඩගින්න / කුසගින්න / ක්ෂුධාව

iii (අ) හමන සුවඳ සිහිලස ලිය මඬුලු වලා
ගිමන නිබඳ සතපා උනිමු ලොබ වලා

(ආ) වලා - පැතිර ගිය / ව්‍යාප්ත
වලා - වනය / වනාන්තරය / කැලය

iv (අ) උපමාව කැරලුන් මහෝත්සාහයෙන් විද ගත් සිදුරුවලින් ගිරවුන් ප්‍රයෝජන විඳුනා සේ

(ආ) උපමේය මා රුස් කළ සම්පතින් ප්‍රයෝජන විඳින්නෝ බත් බැළයාණෝ ය.

v (අ) කාව්‍යශේඛරය

(ආ) උලකුඩය දේවිය / ලෝකනාථා දේවිය

vi (අ) සද්ධර්මාලංකාරය

(ආ) බලවත් / බලසම්පන්න / බලයෙන් යුක්ත / ප්‍රබල

vii (අ) සුඛාන්ත / දුක්ඛාන්ත

(ආ) සුඛාන්ත

viii (අ) කුරුණෑගල යුගය

(ආ) මයුරපාද පරිවෙණාධිපති බුද්ධ පුත්‍ර හිමි / මයුරපාද පරිවේණාධිපති හිමි / මයුරපාද පරිවේණාධිපති

ix (අ) ගොදුරු ලොබ, පැදි දියට බොර දිය, කාටත් මා එපා වෙලා, බව තිමිර

(ආ) කේතුමතී හෝටලයේ රාත්‍රියක්, කැනල් පාරේ නිශාචරයෝ

x (අ) වදන් කවි පොත, තුන් සරණ, වෙසතුරු දා කව, සොකරි කවි කතාව, ගණදෙවි හෑල්ල

(ආ) සැළලිහිණි සංදේශය, පරෙවි සංදේශය

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




අනිවාර්ය ප්‍රශ්නයක් වන මෙය තෝරාගෙන ඇත්තේ 95% ක ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන්

ලකුණු 00-05 අතර 25% ක් ද
ලකුණු 06-10 අතර 31% ක් ද
ලකුණු 11-15 අතර 32% ක් ද
ලකුණු 16-20 අතර 12% ක් ද

ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයෙහි අනුකොටස් විස්සක් ඇතුළත් වේ. එම කොටස්වලින් (ix) (අ) කොටස සඳහා 84%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇතත් (iii) (ආ) කොටස සඳහා සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 6%ක් පමණ අඩු පිරිසකි. එනම් පහසුතාව වැඩිම අනුකොටස (ix) (අ) වන අතර පහසුතාව අඩුම අනුකොටස (iii) (ආ) වේ.

නිර්දිෂ්ට නූතන පුරාතන ගද්‍ය පද්‍ය නාට්‍ය ආදී සෑම අංශයක්ම ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නයෙහි අනුකොටස් ඉදිරිපත් කර තිබුණි. සාහිත්‍යය පිළිබඳ අවධානයත් මතකයත් මැන බැලීම සඳහා ඉදිරිපත් කර තිබූ (iii)(අ) අනුකොටසට පිළිතුරු සපයා තිබුණේ 26% ක පමණ ප්‍රමාණයකි. මෙයින් පැහැදිලිවන්නේ කවි කටපාඩම් කිරීමට සිසුන් නොපෙලඹෙන බවයි. එහෙත් මිහිරි ලෙස කවි ගායනා කිරීමෙන්/ කරවීමෙන් සිසුන් මේ සඳහා පොලඹවා ගත හැකියි. (iii) (ආ) අනුකොටසට 6% ක පමණ ඉතා අඩු ප්‍රතිශතයක් පිළිතුරු සැපයීමෙන් පැහැදිලිවන්නේ සිසුන් තුළ බහු අර්ථ පද පිළිබඳ අවබෝධය ඉතා විරල බවයි. මෙබඳු තැන් මැනවින් ප්‍රයෝජනයට ගෙන සාහිත්‍යය පිළිබඳ සිසුන්ගේ ඇල්ම වර්ධනය කිරීමත් වාක් කෝෂය පුළුල් කිරීමත් කළ හැකිය. එබැවින් මෙබඳු තැන් පිළිබඳව ගුරුභවතුන්ගේ වැඩි අවධානය යොමු විය යුතුය.

## 02. ප්‍රශ්නය

අපේක්ෂණය : 1. නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය
2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

ලකුණු විග්‍රහය : ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 20 යි.
එක් කොටසකට ලකුණු 05 බැගිනි. තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදිව තේරුම් ලියා ඇත්නම්
එක් වචනයක ලකුණු 01 බැගින් - ලකුණු 02 යි
සමස්ත අර්ථයට - ලකුණු 03 යි

පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) බත් බැළයා මා නිල කළ සම්පත **ධරා ලිය නොහෙන** නියා ය. රුස් වූවන් ඒ නිසා **කොක්සන් ගසන** නියා යයි සිතා එපවත් දන්නා පිණිස මිනිසුන් එවූ ය.

(ii) එසේ හෙයින් **බන්ධනයෙහි වැදහෙව** දුක් අනුභව කිරීමෙන් මට ප්‍රයෝජන කිම් ද? **මන්ත්‍රය පිරුවා** සත්‍රුවන් වර්ෂා වස්වා සොරුන්ට වස්තු දී සැප සේ යෙමි.

(iii) කොල්ලන් කෙල්ලන් පොබයන්නී
මහලු සිතෙත් **කෙළි රිසි** ලන්නී.
ගෙයි ගෙයි **බක් වෙස්** ගන්වන්නී.
අවුරුදු කිරි බත උයවන්නී.

(iv) රසඳුන් නුවනැඳ
බුලතින් **රතොට** **පහද**
අත් කවුතුක බැඳ
සද **පෝමන්** විතර එළඳ

*(ලකුණු 05 × 04 = 20 යි)*

අපේක්ෂිත පිළිතුරු

i. ධරා ලිය නොහෙන - දරා ගත නොහැකිව / දරා ගැනීමට අසමත්ව / උසුළා ගත නොහැකිව
කොක්සත් ගසන - මහත් හඬින් සිනාසෙන / කොකුන් වගේ කෑ ගසන / මහ හඬින් කෑ ගසන

බත් බැළයා මා නියම කළ සම්පත් දරා ගත නොහැකිවා වැනි ය. එම නිසා රැස් වූ පිරිස මහ හඬින් කෑ ගසන්නේ යයි සිතා ඒ බව දැන ගැනීම පිණිස මිනිසුන් යැවුය.

ii. බන්ධනයෙහි වැද හෙව - බැඳීම්වලින් / බැමිවලින් බැඳ / සිර බාරයට පත්ව / සිරකරුවකු වී
මන්ත්‍රය පිරුවා - මන්ත්‍රය සම්පූර්ණයෙන් කියා / මන්ත්‍රය ජපකර / මන්ත්‍රය මතුරා

එම නිසා බැමිවලින් බැඳ දුක් විඳීමෙන් මට ප්‍රයෝජනය කුමක්ද? මන්ත්‍රය ජපකර සත් රුවන් වර්ෂාව වස්සවා සොරුන්ට එම වස්තුව දී මම සැපසේ යමි.

iii. කෙළි රිසි - ක්‍රීඩාවට කැමති / සෙල්ලමට කැමති / ක්‍රීඩාවට ආසාව ඇති
බක් වෙස් - බක් මාසයේ ස්වරූපය / අවුරුදු අසිරිය / අප්‍රේල් මාසයේ සිරිය

තරුණ තරුණියන් අතර ප්‍රබෝධවත් ගතියක් ඇතිකරවයි. / මහලු අය තුළ ද ක්‍රීඩාවට කැමති බවක් ඇති කරවයි. ගෙයක් ගෙයක් පාසා අවුරුදු අසිරිය දක්නට ලැබෙයි. අවුරුද්ද උදාවත්ම කිරිබත උයවයි.

iv. රතොට පහදා - තොල් රතුපාට කරවා
පෝමන් - ශක්ති ප්‍රමාණයෙන් / හැකි පමණින් /පොහොසත් පමණින්

ඇස්වල රසාංජන ගල්වා බුලත්වලින් තොල් රතුපාට කරවා විවාහයේදී මනාලියගේ අතෙහි බඳින නූලක් බැඳ තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් කාන්තාව සරසනු ලැබීය.

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




අනිවාර්ය ප්‍රශ්නයක් වන මෙය තෝරාගෙන ඇත්තේ 90%ක පමණ ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.
ඉන් ලකුණු 00-05 අතර 32%ක් ද
ලකුණු 06-10 අතර 29%ක් ද
ලකුණු 11-15 අතර 25%ක් ද
ලකුණු 16-20 අතර 14%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්ත වන අතර, එම කොටස් හතරෙහි පහසුතා පිළිවෙළින් 44%, 53%, 50% හා 35% වේ.

මෙම ප්‍රශ්නයෙහි iv කොටසෙහි පහසුතාව 35% ක් තරම් අඩුවෙන් මෙන්ම කිසිදු කොටසක පහසුතාව 53% නොඉක්මවීමෙන් ද පැහැදිලිවන්නේ පැරණි සාහිත්‍යය පිළිබඳ සිසුන්ගේ ඇල්ම අල්ප බවයි. ඉතාම සරල අයුරින් කවිවල අර්ථ පහදා දීම, මැනවින් ගැයීම ආදී උපක්‍රම භාවිතයෙන් සිසුන් මේ කෙරෙහි පොලඹවා ගත හැකිය.

**සටහන** : අංක 3 සිට 7 තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් තොරතුරු අදාළ වේ.

**අපේක්ෂණ** : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

**ලකුණු විග්‍රහය** : 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ. එකකට ලකුණු 15 බැගිනි.

3, 4 ප්‍රශ්නවල තෝරා ගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන් ව විස්තර සහිතව ලියා තිබිය යුතුය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

| | | |
|---|---|---|
| උදාහරණ 04ට | - | ලකුණු 04 යි |
| සමස්ත විස්තරයට | - | ලකුණු 11 යි |
| එකතුව | - | ලකුණු 15 යි |

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතු ය. ඒ සඳහා ලකුණු 10 ක් හිමි වේ.

03 ප්‍රශ්නය

- **3, 4 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ තිබීම සෑහේ.**

**3. "පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා" කෙටි කතාවෙන්,**

**(i) ධනවත් සමාජයේ හරසුන් බවත්**

**(ii) දිළිඳු සමාජයේ අව්‍යාජත්වයත්**

**මනාව පැහැදිලි වන අයුරින් චරිත හසුරුවා ගැනීමට කතුවරයා සමත් ව ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.** *(ලකුණු 15 යි)*

අපේක්ෂිත පිළිතුර

(i) ධනවත් සමාජයේ හරසුන් බව :-
කථා නායකයාගේ ( බාබුජී ) හෝ ඔහුගේ මවගේ හෝ චරිත හසුරුවා ඇති
ආකාරය පිළිබඳ අදාළ කරුණු දෙකක්වත් දක්වා තිබීම
බාබුජීගේ චරිතය - මාන්නක්කාර බව, මුදල් පිළිබඳ ඉහළින් සිතීම
බාබුජීගේ මෑණියන් රාසුල්පු දුටු ආකාරය - දිළින්දන් කෙරේ හෙළන අකාරුණික බව,
අන්ධ ආගමික විශ්වාසය

(ii) දිළිඳු සමාජයේ අව්‍යාජත්වය :-
රාසුල්පුගේ චරිතය නිරූපණය වන විවිධ අවස්ථාවලින් දෙකක්වත් දක්වා තිබීම
ප්‍රියමනාප බව, අවංක බව, අනුන්ට උදවු කිරීමට ඇති කැමැත්ත
උගතකු නොවූවත් ගුණවත් බව, මුදලට වඩා මිනිස් කම අගය කරන බව

**නැතහොත්**

**මහුල් ගීය / වසන්ත සමය පැදිපෙළ රසවත් කාව්‍ය නිර්මාණයක් වී ඇත්තේ,**

**(i) උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීම**

**(ii) ස්වභාව සෞන්දර්යය මැනවින් වර්ණනයට ලක් කිරීම**
**යන කරුණු නිසා ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.** *(ලකුණු 15 යි)*

අපේක්ෂිත පිළිතුර

(i) උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීම

- කාව්‍යමය ආකෘතිය තුළින් සජීවී බව මතු කිරීම
  ශබ්දධ්වනි, අනුප්‍රාසය, විරිත, එළිසමය
- රූපක
  සිසිර කුමාරි, දිනිසුරු කුමරු, ලෝ කත

(ii) ස්වභාව සෞන්දර්යය මැනවින් වර්ණනයට ලක් කිරීම

- ස්වභාව සෞන්දර්යයේ දක්නට ලැබෙන වස්තු විචිත්‍ර ආකාරයෙන් ඉදිරිපත් කිරීම
  ගස්, මල්, මී මැස්සන්, පක්ෂීන්, පලතුරු ආදිය
- ස්වභාව සෞන්දර්යයට සජීවී බවක් ආරෝපණය කිරීම
  ( උදාහරණ දක්වමින් මෙම කරුණු විස්තර කර තිබිය යුතුය. )

උදාහරණ 04 සඳහා ලකුණු 04 යි.
සමස්ත විස්තරයට ලකුණු 11 යි.
(ලකුණු 15 යි)

මෙම උදාහරණ හෝ වෙනත් උචිත කරුණු දක්වා ඇත්නම් අදාළ ලකුණු ලැබේ.

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙය ද අනිවාර්ය ප්‍රශ්නයකි. එහෙත් තෝරාගෙන ඇත්තේ 86% ක් පමණ ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15 ක් හිමි වේ.
ඉන් ලකුණු 00-03 අතර 18%ක් ද
ලකුණු 04-07අතර 21%ක් ද
ලකුණු 08-11 අතර 34%ක් ද
ලකුණු 12-15 අතර 27%ක් ද
වශයෙන් ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත වන අතර ඉන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
ඒ අනුව
පළමුවන කොටසට අයත්
(i) කොටසෙහි පහසුතාව 78% ක් ද
(ii) කොටසෙහි පහසුතාව 53% ක් ද
දෙවන කොටසට අයත්
(i) කොටසෙහි පහසුතාව 93% ක් ද
(ii) කොටසෙහි පහසුතාව 59% ක් ද වේ.

විකල්ප කොටස් දෙකක් සහිත මෙම ප්‍රශ්නයෙහි 'පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා' කෙටිකතාව ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු සැපයීමෙන් ලැබූ ලකුණුවලට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් 'මඟුල් ගීය' කවි පන්තිය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු සැපයීමෙන් ලබා ගැනීම පහසුවී ඇත. එසේ වන්නට ඇත්තේ එම කවි පන්තියේ බස සරල වීමත් විරිත කෙටි වීමත් නිසා උදාහරණ මතකයෙන් ලිවිය හැකි බැවින් විය යුතුය.

04 ප්‍රශ්නය

**4.** **සඳකිඳුරු ද කාව්‍යය වඩාත් සාර්ථක වී ඇත්තේ,**

**(i) කිඳුරු යුවළගේ සුන්දර ජීවිතයත්,**

**(ii) කිඳුරාගේ වියොවින් තැවෙන කිඳුරිය නගන ශෝකාලාපයත්,**

**මැනවින් සුසංයෝග කරමින් පද්‍ය නිර්මාණය වී ඇති නිසා ය. එක් කරුණකට උදාහරණ දෙක** බැගින් දක්වමින් **පැහැදිලි කරන්න.** *(ලකුණු 15 යි)*

අපේක්ෂිත උත්තරය

i කිඳුරු යුවළගේ සුන්දර ජීවිතය

මේ කවි පෙළෙහි බොහෝ කවිවල මුල් දෙපදයෙන් විස්තර වනුයේ කිඳුරු යුවළගේ සුන්දර දිවියයි.

උදා :- උපුල් කඩාගෙනැ කනලා සුපුල් වන
ලකල් කුසුම් දම් කරලා එකල් වන

මේ සඳහා උචිත කවි පද යොදාගෙන විස්තර කර ඇත්නම් ලකුණු ලැබේ.

ii කිඳුරිය නගන ශෝකාලාපය

එම කවිවලම අවසන් පද දෙකෙන් විස්තර වන්නේ කිඳුරාගේ වියෝවෙන් තැවෙන කිඳුරිය නගන ශෝකාලාපයයි. එබැවින් උචිත කවිපද ලියා විස්තර කර ඇත්නම් ලකුණු ලැබේ.

උදා :- නිමල් මෙනුඹ සහ විදි සැප විපුල් වන
සිහිල් සෙවන උන් මට මේ තැවුල් වන

මේ ආකාරයට අවස්ථා දෙක සංයෝජනය කර ඇති අයුරු දැක්වෙන කවිවලින් උදාහරණ දක්වා තිබීම අවශ්‍ය ය.

උදාහරණ සඳහා ලකුණු 04 යි
සමස්ත විස්තරයට ලකුණු 11 යි
(මුළු ලකුණු 15 යි)

**නැතහොත්**

**සද්ධර්මරත්නාවලි කතුවරයා සතු ප්‍රතිභාපූර්ණත්වය මැනවින් විදහා දක්වෙන්නේ,**

**(i) කතාවේ සංසිද්ධීන්ට උචිත ලෙස චරිත හැසිරවීම**

**(ii) මනා ලෙස භාෂාව හැසිරවීම**

**යන කුසලතා නිසා ය. නියමිත කොටසින් උදහරණ දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 15 යි)*

අපේක්ෂිත පිළිතුර

(i) සංසිද්ධිවලට උචිත ලෙස චරිත හැසිරවීම

- ගන්ධක සිටාණන්ගේ චරිතය
  ගන්ධක සිටාණන් හා භාණ්ඩාගාරික ලේකම් අතර ඇතිවන කතා බහ
- ධනය පරිභෝජනය කර අවසන් කිරීමට සිතූ සිටාණන් ඒ සඳහා බත් කන මණ්ඩපයක් ඉදිකිරීමට වියදම් කිරීම
- පිටිසර වැසියන්ට බත් දීමට අකැමැති වීම

බත් බැළයාගේ චරිතය

- ගන්ධක සිටාණන්ගේ බත් තළියෙන් බත් පිඩක් කෑමට ආශාවක් ඇති වීම
  "තෙල බත් තළියෙන් බත් පිඩකට ආශා ඇති වී ය"යි කිවුය.
- "සබඳ ඒ නොලදිම් නම් ජීවත්විය නො හෙමි."
- "සිටාණන් දීලන්ට මැළියා සේ ම මමත් ආලය හැරගන්නට මැළියෙමි.
  නොලදොත් මියෙමි."
- "සබඳ යහපතියි කියා ලා අඹුදරුවනුත් හැර එක බත් තළිය වුවත්......"
- බත් තළිය දන්දීම
  " පෙර මා දනක් දී ලිය නුහුණු හෙයින් එක බත් තළියක් නිසා තුන් හවුරුද්දක්...."
- " ස්වාමීනි මේ එක් කෙනෙකුට මුත් වඩා නොසෑහෙන බත දෙභාග කරන්නට බැරිය."

(ii) මනා ලෙස භාෂාව හැසිර වීම

- පොදු ජන වහර
  "ස්වාමීනි මෙතෙක් වස්තු මුඹගේ දෙමාපියන් සන්තක දෙය ය."
  "තුලුන්ට දුන් නියා බලා යම් යම් කෙනෙක් ඉල්වූ නම් උන් උන්ට දෙන කලට අප අනුභව කරන්නේ කිම් ද?"

- උපමා භාවිතය
  "දකුණු මුහුද ගමන් ගත් නැවක් මෙන්"
  "කොට නිමි වොටුන්නේ ඔබන මැණිකක් මෙන්"
  "පෙර දෙපෝයේ සඳ පරිද්දෙන් "

- සංවාදශීලි බස සජීවි ලෙස යොදා ගැනිම
  - නගර වැසියා හා ගන්ධක සිටාණන් අතර ඇති වූ සංවාදය
  - භාණ්ඩාගාරික ලේකම් හා සිටාණන් අතර සංවාදය

- අවස්ථාචෝචිත ව බස් වහර යොදා ගැනිම
  - කෙටි වැකි භාවිතය
  - දිගු වැකි භාවිතය

උදාහරණ සඳහා ලකුණු 04 යි
සමස්ත විස්තරයට ලකුණු 11 යි
(මුළු ලකුණු 15 යි)

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




මෙය ද අනිවාර්ය ප්‍රශ්නයකි. එහෙත් තෝරාගෙන ඇත්තේ 78% ක ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15 ක් හිමි වේ.
ඉන් ලකුණු 00-03 අතර 24% ක් ද
ලකුණු 04-07 අතර 21% ක් ද
ලකුණු 08-11 අතර 28% ක් ද
ලකුණු 12-15 අතර 27% ක් ද
වශයෙන් ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය ද කොටස් දෙකකින් යුක්ත වන අතර ඉන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. ඒ අනුව පළමුවන කොටසෙහි

(i) කොටසෙහි පහසුතාව 80% ක් ද

(ii) කොටසෙහි පහසුතාව 52% ක් ද

දෙවන කොටසෙහි

(i) කොටසෙහි පහසුතාව 74% ක් ද

(ii) කොටසෙහි පහසුතාව 45% ක් ද වේ.

මෙය ද විකල්ප කොටස් දෙකක් සහිත ප්‍රශ්නයකි. එයින් 'කිඳුරු විලාපය' කවි පන්තිය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු සැපයීම මඟින් පැරණි ගද්‍ය කාව්‍යයක් වන 'සද්ධර්ම රත්නාවලිය' ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු සැපයීමෙන් ලබා ගන්නවාට වඩා පහසුවෙන් වැඩි ලකුණු ප්‍රමාණයක් ලැබිය හැකිව තිබුණු බවයි. මෙයින් ද පැහැදිලි වන්නේ ද පැරණි ගද්‍ය සාහිත්‍යය සඳහා සිසුන්ගේ ඇති අඩු ඇල්මයි. ඉතා සරලව, නාට්‍යානුසාරයෙන් ඉගැන්වීම වැනි උපක්‍රම යෙදීමෙන් පැරණි සාහිත්‍යය පිළිබඳව සිසුන්ගේ ඇල්ම හා අවබෝධය වැඩි කළ හැකිය.

05 ප්‍රශ්නය

**5. 'පූජාවලිය කතුවරයා පාඨක සිත් ඇද ගන්නා ආකාරයෙන් කතා ලිවීමෙහි හැකියාවක් ඇති අයෙකි' නියමිත කොටසින් උදාහරණ තුනක් දක්වමින් මෙම කියමන පැහැදිලි කරන්න.** *(ලකුණු 10 යි)*

අපේක්ෂිත උත්තරය

i කුතුහලය දනවන අයුරින් අවස්ථාව ඉදිරිපත් කිරීම

- දිසාපාමොක් ආචාරීන් ළඟට ශිල්ප ලබා ගැනීමට යන අවස්ථාවේ තමා හඳුන්වා දුන් ආකාරය
- " ආචාරී "තෙපි කවුරුදැ" යි " විචාල කල අනිකක් කීම් නම් මා කෙරෙහි අදර නොකරති' යි සිතා..."
- "ආචාරී භාගය ගෙනවුදැ' යි.....
  දෙමාපියන්ට නොකියා ශිල්ප ලෝභයෙන් සොරා ආයිමි.... "

ii ජීවක වෛද්‍යාචාර්යවරයා කළ විවිධ පිළියම් ආශ්‍රයෙන් විශ්වසනීයත්වය ගොඩ නැගෙන ආකාරයෙන් කරුණු ඉදිරිපත් කිරීම

- රජ, සිටුවරුන් වැනි ප්‍රභූන්ගේ රෝග සුව කිරීම
- රෝගීන්ගෙන් ප්‍රශ්න අසන ආකාරය
  මත්ථලුංගභෝජක නම් පණුවන් දෙදෙනකු ඇති බව පවසා ප්‍රතිකාරයට මාස 21 ක් දින නියම කර දවස් 21 කින් සුව කිරීම

iii භාෂා උපක්‍රම :- කෙටි වැකි මගින් පාඨක සිත් ග්‍රහණය කර ගැනීම.
උදා :-

- මාගේ කිසි නෑසිය කෙනෙකුත් නැත, මතු මට හිමිවන කුල සැපතෙකුදු නැත.
- වෛද්‍ය ශාස්ත්‍රය නම් දතුවා හට මෙලොවත් වැඩ වෙයි. පරලොවත් වැඩ වෙයි. පින් වෙයි.

iv  අවස්ථා නිරූපණය

උදා :-

- අපි සන්හිඳුවම්හ අපි සන්හිඳුවම්හයි වාසි කිය කියා.....
- සිටාණන්ගේ ගෙට අපි අපි යයි වාසි කිය කියා මුළු බැඳ එන....

v  උපමා යෙදීම

- " ඉස්මුල් සැත් ලාලා ලියා හරණා සේ "
- " මාගේ නුවර නැඟු ධ්වජයක් සේ "
- " අමා දිය ලදුවන් සේ "

උදාහරණ සඳහා ලකුණු 03 යි
සමස්ත විස්තරයට ලකුණු 07 යි
( මුළු ලකුණු 10 යි)

**මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු ඉදිරිපත් කර ඇත්නම් අදාළ ලකුණු දෙන්න.**

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති ප්‍රතිශතය 14% ක් පමණ වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමිවේ.
ඉන් ලකුණු 00-02 අතර 25%ක් පමණ ද
ලකුණු 03-05අතර 23%ක් පමණ ද
ලකුණු 06-07 අතර 23%ක් පමණ ද
ලකුණු 08-10 අතර 29%ක් පමණ ද
වශයෙන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයෙහි කොටස් අඩංගු නොවන බැවින් සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කර ඇත. එම ලකුණුවල සාමාන්‍යය එනම්, ප්‍රශ්නයෙහි පහසුතාව 41%කි.

මෙය පැරණි ගද්‍ය සාහිත්‍යය ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයක් විය. සතුටුදායක ලෙස පිළිතුරු සපයා ඇති සංඛ්‍යාව මධ්‍යස්ථ මට්ටමක විය. ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 14% ක් පමණ අඩු සංඛ්‍යාවකි. ඔවුන් අතුරින් 25% ක් ම ලබාගෙන ඇත්තේ ප්‍රශ්නයට හිමි ලකුණු 10 න් ලකුණු 2 ක් හෝ ඊට අඩුවෙනි. මෙයින් නිගමනය කළ හැක්කේ ප්‍රශ්නය තෝරා ගැනීම මෙන්ම ප්‍රශ්නයට ලකුණු ලබාගැනීම ද පහළ මට්ටටමක පවතින බවයි. පැරණි ගද්‍ය සාහිත්‍ය කෘති වින්දනාත්මකව ලිහිල්ව සිත්ගන්නා ලෙස රස විඳීමට සිසුන් හුරු කළ යුතුය. එමගින් ඒවාට ඇති ඇල්ම වැඩි කළ හැකිය. මෙවැනි ප්‍රශ්න සඳහා වැඩි ලකුණු ප්‍රමාණයක් ගත හැකි ලෙස පිළිතුරු ලියන ආකාරය ද සිසුන්ට වටහා දිය යුතුය.

ප්‍රශ්න අංකය - 06

**6.** **පවතින සමාජ අසාධාරණය හමුවේ දිළිඳු දරුවකු මුහුණ දෙන ශෝචනීය අත්දැකීම් දැඩි සංයමයකින් යුතුව කවියට නැගුණු අවස්ථාවක් ලෙස 'පියසේන ඇසූ ප්‍රශ්නයක්' යන පැදිපෙළ අගය කළ හැකි ය. උදහරණ තුනක්** දක්වමින් පැහැදිලි **කරන්න.**
*(ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුර

සම වයසේ ළමයින් දෙදෙනකුගේ සමාජ පරතරය නිරූපණය කෙරෙන ආකාරය දැක්විය යුතුය.

පියසේනගේ අරමුණ පුංචි බේබිත් සමඟ පාසල් ගොස් අධ්‍යාපනය ලැබීම, පියසේන සුදුසුකම් ලබා දෙකේ පංතියෙන් තුනේ පංතියට සමත්වීම, පාඨකයා තුළ ද්වේෂයක්, වෛරයක් සමාජයට එල්ල නොවන අයුරින් ඉතා සංයමයෙන් යුතුව කවියා තම අදහස් ඉදිරිපත් කර ඇති ආකාරය දක්වා තිබිය යුතුය.

පියසේනගේ ප්‍රශ්නය පාඨකයාට විසඳීම සඳහා ඉදිරිපත් කර ඇති ආකාරය - ආදිය පිළිතුරට ඇතුළත් විය යුතුය.

ඉහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් උදාහරණ 3ක් වත් විස්තර කර ඇත්නම් ඉහළ ලකුණක් ප්‍රදානය කරන්න. පොතේ උපුටන ඒ ආකාරයෙන්ම නැතත් විස්තර කර ඇත්නම් ලකුණු පිරිනමන්න.

උදාහරණ අවස්ථා සඳහා ලකුණු 03 යි
සමස්ත විස්තරයට ලකුණු 07 යි
(මුළු ලකුණු 10 යි)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති ප්‍රතිශතය 58%ක් පමණ වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00-02 ත් අතර 8% ක් පමණ ද
ලකුණු 03-05 ත් අතර 16% ක් පමණ ද
ලකුණු 06-07 ත් අතර 34% ක් පමණ ද
ලකුණු 08-10 ත් අතර 42% ක් පමණ ද
වශයෙන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නයෙහි ද කොටස් අඩංගු නොවන බැවින් සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කර ඇත. එම ලකුණුවල සාමාන්‍යය එනම්, ප්‍රශ්නයෙහි පහසුතාව 67%කි.

මෙය අනිවාර්ය ප්‍රශ්නයක් නොවන නිසා තෝරා ගැනීමේ ප්‍රතිශතය 58% ක් පමණ වේ. සරල මෙන්ම සිසුන්ගේ සිත්ගන්නා කවි නිර්මාණයක් පදනම් වීම නිසා ලකුණු ලබාගැනීමේ දුර්වල බවක් නොපෙනේ. මෙබඳු ශෝචනීය සිදුවීම් අළලා සරල කවි නිර්මාණය කිරීමට සිසුන් පෙලඹවීම ආදියෙන් සිසුන්ට තව තවත් සාහිත්‍යය ළං කළ හැකිය.

07 ප්‍රශ්නය

**7.** **නාට්‍යෝචිත අවස්ථා බහුල වන ආකාරයට සිද්ධි ගැළපීම මගින් නාට්‍යයේ අවසානය දක්වා ම ප්‍රේක්ෂකයා ඇද, බැඳ තබා ගැනීමට 'මහුල් ප්‍රස්තාව' නාට්‍ය රචකයා සමත් වී ඇත. නාට්‍යයේ පෙළ ඇසුරෙන් උදාහරණ දක්වමින් විස්තර කරන්න.**
*(ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුර

**ලව්නේරිස් තෙපානිස්ගේ ගෙදරට පැමිණීම, එහිදී ඇතිවන කතා බහ තුළින් ඇතිවන කුතුහලය**

- ආ ළමයා.... කවුද ?  මේ ඇත්තටම ? ලව්නේරිස් නේද ?
- අද මොකද මේ හැටි උජාරුවට මේ ළමයා ඇඳ පැලඳ ගෙන එහෙම ?
- පුතා මම කොච්චර සන්තෝස ද ?
- තෙපානිස් ලව්නේරිස්ගේ යෝජනාව ගැන නන්දාවතීට නොපැවසීම
- තාත්තා කිව්වේ බඩු වගයක් ගන්න කවුදෝ මුදලාලි කෙනෙක් ඇවිල්ලා ඉන්නවායි කියලා
- විවිධ අවුල් ඇති කර තර්ක කර ගැනීම
- ගෝනහේනට - හඳයා සහ වල්ලියාට වැනි නාට්‍යෝචිත අවස්ථා සඳහා උචිත උදාහරණ දක්වමින් විස්තර කර තිබිය යුතුය.

(ඉහත කරුණු අනුව සිද්ධි එකිනෙක ගළපා ඉදිරිපත් කර තිබීමත්, කථා සන්දර්භයේ ඇති සුවිශේෂී බව විස්තර කර තිබීමත් අවශ්‍ය ය.)

| | |
|---|---|
| උදාහරණ අවස්ථා සඳහා | ලකුණු 03 යි |
| සමස්ත විස්තරයට | ලකුණු 07 යි |

(එකතුව ලකුණු 10 යි)

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 13%ක් පමණ ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන් ලකුණු 00-02 ත් අතර 25% ක් පමණ ද
ලකුණු 03-05 ත් අතර 34% ක් පමණ ද
ලකුණු 06-07 ත් අතර 27% ක් පමණ ද
ලකුණු 08-10 ත් අතර 14% ක් පමණ ද
වශයෙන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නයෙහි ද කොටස් අඩංගු නොවන බැවින් සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කර ඇත. එම ලකුණුවල සාමාන්‍යය එනම්, ප්‍රශ්නයෙහි පහසුතාව 43%කි.

මෙයට පිළිතුරු සපයා තිබූ සංඛ්‍යාවෙන් බහුතරයක්ම අඩු ලකුණු ලබා තිබූ බව පෙනේ. ලිහිල් බසින් හා වින්දනාත්මකව රචනා වී ඇති මෙම නාට්‍යය ඇසුරෙන් අසා තිබූ ප්‍රශ්නයේ සිද්ධි ගැළපීම හා 'නාට්‍යෝචිත අවස්ථා' හඳුනාගැනීම සිසුන්ට දුෂ්කර වූ බව පෙනේ. නිර්දේශිත නාට්‍යය පිළිබඳව රසවින්දනාත්මකව හැදෑරීමට සිසුන් හුරු කළ යුතුය.

අංක 5, 6 හා 7 යන ප්‍රශ්න තුන අතුරින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු විය. ඒවා තෝරාගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශත පිළිවෙළින් 14%, 58% හා 13% ක් වේ. ඒ අනුව පෙනීයන්නේ අනෙකුත් ප්‍රශ්න දෙකට සාපේක්ෂව හයවන ප්‍රශ්නය තෝරා ගැනීමේ වැඩි ප්‍රවණතාවක් තිබූ අතර තෝරා ගැනීමේ අඩුම ප්‍රවණතාව ඇත්තේ 7 වන ප්‍රශ්නයට බවයි.

ඒ එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන් ලැබූ ලකුණු ඇසුරින් කරන ලද ගණනයට අනුව ඒවායේ පහසුතා පිළිවෙළින් 0.41, 0.67 හා 0.43 විය. එසේම එම එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන් අතුරින් ප්‍රශ්නයට හිමි ලකුණුවලින් හරි අඩකට වැඩියෙන් ලැබූ ප්‍රතිශත පිළිවෙළින් 52%, 76% හා 41% විය.

මේ අනුව පැහැදිලි වන්නේ වැඩි කැමැත්තකින් තෝරා ගනු ලැබූ 6 වන ප්‍රශ්නයට දෙන ලද පිළිතුරු සඳහා සාපේක්ෂ වශයෙන් වැඩි ලකුණු ලැබීමේ ප්‍රවණතාවක් ද වූ බවයි. අනෙකුත් නිර්දිෂ්ට පාඨවලට වඩා නූතන පද්‍ය සාහිත්‍යය කෙරෙහි ශිෂ්‍යයන්ගේ වැඩි අවධානයක් යොමුවී ඇති බව මේ අනුව නිගමනය කළ හැකි වේ.

අංක 5, 6, 7 ප්‍රශ්න අතරින් තෝරාගැනීමේ අඩුම ප්‍රවණතාවක් තිබූ නාට්‍යෝචිත අවස්ථා පිළිබඳ උදාහරණ දක්වමින් ආකර්ෂණීය නාට්‍යයක් රචනා කිරීමට නාට්‍ය රචකයා සමත් වී ඇති බව විස්තර කිරීම අපේක්ෂිත 7 වන ප්‍රශ්නය වැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා අපේක්ෂකයින් පෙලඹවීමත් එවැනි ප්‍රශ්නයකට සතුටුදායක ලෙස පිළිතුරු සපයා වැඩි ලකුණු ලබා ගැනීම සඳහා මගපෙන්වීමත් අරමුණු කරගෙන පහත සඳහන් ආදර්ශ පිළිතුර ඉදිරිපත් කෙරේ.

**7 ප්‍රශ්නය සඳහා ආදර්ශ පිළිතුර - විචාරය**

**මඟුල් ප්‍රස්තාව නාට්‍යයෙහි ආරම්භයේ සිට අවසානය දක්වා ම ප්‍රහසනය මතු කරමින් සිද්ධි ගැළපීමට රචකයා සමත් වී ඇත. මෙය සුඛාන්ත නාට්‍යයකි. අවසානය දක්වා ම ප්‍රේක්ෂකයා ඇද බැඳ ගනිමින් නාට්‍යෝචිත අවස්ථා මතු වන සේ සිද්ධි ගැළපීමට කතුවරයා මෙහිදී සමත් වී ඇත. ඒ ඒ චරිත හැසිරෙන ආකාරයෙන් ද නාට්‍ය රසය තීව්‍ර කිරීමට කතුවරයා උත්සාහ ගනී.**

**හොඳින් ඇඳ පැලඳගත් ලව්නේරිස්, තෙපානිස්ගේ නිවසට පැමිණෙන්නේ ඔහුගේ දුව වන නන්දාවතීට විවාහ යෝජනාවක් ඉදිරිපත් කිරීමටයි. මේ ගැන දන්නේ ලව්නේරිස් පමණි. තෙපානිස් හෝ නන්දාවතී මේ ගැන කිසිවක් නොදනී. මේ නිසා අනවශ්‍ය සිදුවීම් හා කතාබස් සඳහා ආරම්භයේ සිට ම නාට්‍යය යොමුවේ.**

**තම නිවසට එන ලව්නේරිස් දුටු තෙපානිස් පවසන වදන්වලින් මේ බව පැහැදිලි ය. "ආ ළමයා ........ කවුද? මේ ඇත්තටම ලව්නේරිස් නේද? අද මොකද මේ හැටි උජාරුවට මේ ළමයා ඇඳ පැලඳගෙන එහෙම" ආදී වදන්වලින් මෙය පැහැදිලි වේ. තෙපානිස් පවා කෙළින් ම මේ යෝජනාව ගැන නන්දාවතී දැනුවත් කර තිබුණේ නැත. ඔහු දියණියට පවසා තිබුණේ "බඩු වගයක් ගන්න මුදලාලි කෙනෙක් ඇවිත්" බවයි. මේ නිසා අනවශ්‍ය කරුණු මතු කරමින් ඔවුහු විවිධ අවුල් හා තර්ක විතර්ක ඇති කර ගනිති.**

**ලව්නේරිස් තම වත්පොහොසත්කම් ගැන කීමේදී ඉදිරිපත් කරන ගෝනහේන, හඳයා සහ වල්ලියා යන ප්‍රකාශ නිසා තෙපානිස් හා නන්දාවතී බෙහෙවින් කෝපයට පත්වෙති. අවසානයේ ලව්නේරිස් ද කෝපයට පත්ව නිවසින් වහා පිටත්ව යයි. ලව්නේරිස් පැමිණියේ තමාට විවාහ යෝජනාවක් කිරීමට බව දැනගත් නන්දාවතී බෙහෙවින් වික්ෂිප්ත වෙයි. මේ නිසා තෙපානිස්ට සිදුවූයේ ලව්නේරිස් නැවත නිවසට කැඳවාගෙන ඒමටයි.**

**මෙහිදී ද ඔවුන් අනවශ්‍ය කරුණු පිළිබඳ කතා කිරීම නිසා ගැටුම් ඇතිවේ. අවසානයේදී සියල්ල සතුටුදායක තත්ත්වයට පත්ව නන්දාවතීට විවාහ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් නාට්‍යය සමාප්ත වේ.**

**මෙසේ විවාහය පිළිබඳ මනාලියගේ පාර්ශවයේ අය හරිහැටි නොදැනුවත් වීම නිසා අනවශ්‍ය කතා හා ආරවුල් ආශ්‍රිතව සිද්ධි ගැළපීමෙන් නාට්‍යයේ විවිධ අවස්ථා නිරූපණය කෙරේ. මේ අනුව නාට්‍ය රචකයා නාට්‍යයේ අවසානය තෙක් ම ප්‍රේක්ෂකයා ඇද බැඳ ගැනීමට සමත් වී ඇත.**

## III කොටස

### 3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.

* II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

* ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

**විශේෂ උපදෙස් :**

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම යන අංශ) පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

* අත් අකුරුවල අපැහැදිලි බව, අකුරුවල කොටස් අඩුවීම, විරාම ලක්ෂණ නිවැරදිව භාවිත නොකිරීම ආදී දුර්වලතා මගහැරවීමට ප්‍රාථමික පන්තිවල සිට ම සිසුන් දැනුවත් කිරීම සහ අත් අකුරු ලිවීමේ අභ්‍යාසවල වඩ වඩාත් යෙදවීම කළ යුතුය.

* අක්ෂර වින්‍යාසය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාදීම සඳහා හේතු සහිතව එම රීති ඉගැන්විය යුතුය.

* ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු සහ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව අවබෝධයක් ලබාදීම සඳහා අදාළ පාඩම් ඉතා සරල අභ්‍යාසවලින් ආරම්භ කර ගැඹුරු අභ්‍යාස කරා සිසුන් යොමු කළ යුතුය.

* රචනා, විචාර හා රස වින්දන පිළිතුරුවලින් ප්‍රදර්ශනය විය යුතු විශ්ලේෂණ හැකියාව ඇතුළු චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කරවීම සඳහා බාහිර පොතපත පරිශීලනයට මෙන්ම විද්‍යුත් සන්නිවේදනය ඇතුළු වෙනත් සන්නිවේදන මාධ්‍ය පරිශීලනය සඳහා ද සිසුන් යොමු කළ යුතුය.

* සංශ්ලේෂණ හැකියාව මැනෙන සාරාංශකරණයට හුරු කරවීම සඳහා අනිවාර්යයෙන් ම සාරාංශකරණ අභ්‍යාසවල යෙදවිය යුතුය.

* රචනා හා රසවින්දනාත්මක පිළිතුරුවලින් ගම්‍යමානවන ස්මරණ ශක්තිය දියුණු කිරීම සඳහා 10, 11 ශ්‍රේණිවල මුල් වාරවලදී ගද්‍ය පද්‍ය කොටස් කටපාඩම් කරවීමට යොමු කළ යුතුය.

* අර්ථාවබෝධය, ලිවීමේ දුර්වලතා මග හරවා ගැනීම සඳහා සතතාභ්‍යාසයේ යෙදවිය යුතුය.

* නිර්දිෂ්ට ග්‍රන්ථ හා කතුවරුන් පිළිබඳ ව තොරතුරු එක්රැස් කර විය යුතුය.

* රාජකාරි ලිපි, ව්‍යාපාරික ලිපි ඇතුළුව ලිපි ලිවීමේ අඩුපාඩු සකස් කිරීම සඳහා ඒවායේ ආකෘති පිළිබඳ මූලික අවබෝධයක් ලබාදිය යුතුය.

* පුවත්පත් වාර්තා ලිවීම වැනි ප්‍රායෝගික කුසලතා ප්‍රවර්ධනය කරවීම සඳහා ප්‍රායෝගික ලෙස පුවත්පත්වලට ලිපි ලිවීමේ අවස්ථා උදාකර දිය යුතුය.

* භාෂාව ඉගැන්වීමේදී සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා නූතන ක්‍රම විධි අනුගමනය කළ යුතුය. මෙහිදී සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින උදාහරණ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

* භාෂාව විෂයය යටතේ එක් එක් පාඩම ඉගැන්වීමේදී එම පාඩමෙහි අරමුණු පැහැදිලිව හඳුනාගත යුතු අතර එම අරමුණු පදනම්කර ගනිමින් විෂය නිර්දේශයේ අභිමතාර්ථ සහ ඉගෙනුම්ඵල සපුරා ගැනෙන පරිදි පිහිටුවාගත් ඉලක්ක ඔස්සේ එම පාඩම් සංවිධානය කරගත යුතුය.

* භාෂාවේ නව ප්‍රවණතා හා වෙනස්කම් හඳුනාගෙන ඒවා සජීවී ලෙස ඉගැන්වීමේ කාර්යය සඳහා යොදාගත යුතුය. (නිදසුනක් ලෙස වත්මන් ව්‍යවහාර භාෂාව උපයෝගි කරගෙන සන්ධි පාඩම ඉගැන්වීම)

* සංවේදී භාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහිකිරීමෙහිලා සාහිත්‍යයෙන් සිදුවනුයේ අපමණ මෙහෙයකි. එවන් පුද්ගලයින් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරුභවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.

* ලකුණු 30ට වඩා අඩුවෙන් ලබා ගත් සංඛ්‍යාව 14.33% කි. (7 වන පිටුවෙහි ඇති 1.2.7 වගුව බලන්න.) ඒ අතරින් ලකුණු 20ට වඩා අඩුවෙන් ලබාගත් සංඛ්‍යාව 6.48 කි. මෙය සැලකිය යුතු දුර්වලතාවකි. මේ ප්‍රමාණය හැකිතාක් අවම කර ගැනීමට පියවර ගත යුතුය.

* 11 වන ශ්‍රේණියේ පැවැත්වෙන වාර විභාගවලදී සිංහල විෂයය සමත්වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය. යම් ප්‍රමාණයකට භාෂා කුසලතා ලබා ඇති ඔවුන් විභාගය සමත්වීමේ ලකුණට ළඟා කරවීමට එමඟින් පහසු වනු ඇත.

* භාෂා විෂය දැනුම වර්ධනය, අනෙකුත් විෂය පවා සාර්ථකව ඉගෙනීමට මහත් රුකුලක් වනු ඇත. එමෙන්ම අනෙක් විෂය උගන්වන ගුරුභවතුන් ද තම ඉගැන්වීම්වලදී භාෂා රීතී නිවැරදිව භාවිත කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ඒවා අනුගමනය කිරීමට සැලකිලිමත් විය යුතුය.